

දෙසු රැසු බසු යා - නොතරනා පැසු යා

| වෙළුම | 1964 අප්රේල් - 2507 බක් | 1 කලබ |
|---|---|---|



පටුන


රූසේ ඉදිරි ගමන

හෙළ බසින් යතුරු ලිවීමේ පහසුව — කුමරතුඟු හෙමසිරි

නා - මුගටි හටන — ඇ. ලොරන්සු රණසිංහ

මගේ බළසිටි සමය - 2 — මොහොට්ටි දෙණු දේවිදු

මල් ගුළාව — චන්ද්රා ආශුබෝධ

සොබා දහම — අරිසෙන් විජයගුණසේකර

දෙවු (G. C. E) සෝදිසියෙහි
ලක් ඉතිහසට රුකුල — කමල් තිලක

පල බර බක් මාසේ — සුනිල් සාන්ත

'පාරිභාෂික' පටලැවිල්ල —

එකට එක — අජිත්

නිල දරුම — කාලිංග විජයවර්ධන.

කියන සිංහලය — කුමරතුඟු මුනිදස්

නිදහස — ඇ. ලොරන්සු රණසිංහ

දළ සල කුමරු ගෙ සැරය —

දරුවනට දඩුවම — අරිසෙන් අහුබුදු

මල් පැණිය - 2 — ඩ. කුමාරසිංහ

ගංගා නදී ආදිය - 2 — සිරිමල් රණවැල්ල


මිල සත 50 යි

## සකසුවන් ගේ හඟවීමෙකි.

හෙළ රුසේ එඩි නැංවීමට මැ ඇරැඹුණු

**‘එඩිය’**

සියත් වැ පවත්වනු සඳහා

**තිර විදහනෙක් පිළියෙළ කැරෙයි.**

එ හෙයින්, එ තෙක්, ලැබූ වසරේ (5 වෙළුමේ) එඩිය පිළිවෙළින් මසින් මසැ මැ නො ආව ද ඉදිරිය සලකා

**හෙළයෝ අප කමත් වා!**

එඩියට එවන ගනු මිල ඈ සියලු මිලත් පැබැඳුමුත් එඩියේ සකසුවන් නමට එවත් වා!

ගල්කිස්සෙ,
හුළුදගොඩ පාරේ 20/1

**අරිසෙන් අහුබුදු**
**ලියනගේ ජිනදස්**
(එඩියෙහි සකසුවෝ)



පොදු සහතික පත් (G. C. E.) සෝදිසියෙහි සිංහලයෙන් ජය ලැබීමේ නිසැක මඟ

අරිසෙන් අහුබුදුවන් ගේ

# දෙවු රුකුල යි.

○ පැබැඳුම, මාදිළි පබඳ ○ හකුළුවා ලිවීම

○ වියරණය, වැකි රීති ○ වරද නිවරද කිරීම

○ රස ගැන්වීම ○ ඈබෑයි

ඈ සියල්ලෙන් යුතු යැ.

**‘විදහා ලිවීම’**

නමින් එක් පිරිසිදිය මෙ පොතට මැ වෙසෙසි වූයෙකි.

**මිල රු 3.00 යි.**

**සීමා සහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම**

කොළඹ, මහනුවර, ගාල්ල, මීගමුව, අනුරාපුර, මාතර, යාපනය.

1964/4/12

# රසේ ඉදිරි ගමන

අද ලොවේ ඇතැම් ජන කෙනෙක් වලා කුළු ඇඳ - ගෙනැ එති; වැසි වස්වති; නිසරු බිම් සරු කෙරෙති; මරු කතර උයන් මවති. තව කෙනෙක් හිම ගිර තරති; මුදු පතුලැ කිමිඳැ පිරික්සති. තව ද කෙනෙක් ගහ මඬුලු පිරික්සති; සඳ මඬුලු මවති; ඉර වටා ගහන් යවති; පිටි සක්වළැ ඇවිඳ එති.

මේ අතර අපි කුමක් කරමු ද? එක මැ බස දෙඩන එක මැ රුසට අයත් අපි කුමක් කරමු ද? ඒ කුලය ඉහළ යැ, මේ කුලය පහළ යැ යි කියමු; ඒ පරපුර වැදූගත් යැ, මේ පරපුර නොවැදූගත් යැ යි බෙණෙමු; ඒ කිතුනුවා යැ මේ බුදුනුවා යැ යි වෙන් කරමු; ඒ දනපති පෙළ යැ, මේ දිළිඳු පෙළ යැ යි කොන් කරමු. තවත් වැඩ කියෙක් ද අපට? පොදුයේ සලකත අදත් අප කවුරුනුත් තව මැ හුවනුයේ පර දෙස යි, හෙළනුයේ සිය දෙස යි; හුවනුයේ පර රුස යි, හෙළනුයේ සිය රුස යි; හුවනුයේ පර බස යි, හෙළනුයේ සිය බස යි.

පර බසෙහි පර රුසෙහි පර දෙසෙහි අගය වනමින් සිය බසෙහි සිය රුසෙහි සිය දෙසෙහි දුබුල් කම් වනමින් අප මේ කරන්නේ කවර විගිළුවෙක් ද? අපටත් බැරි ද අරුන් කරන දැ කරන්නට? මේ තතුවේ සිටැ නම් බැරි බව යි පෙනෙන්නේ.

> "අනුන් පර බසෙකැ
> අගය වනත පුන - පුනා
> සිය අගය පානු බැරි
> හෙළයා මහ නිවටයෙකි"

යනු කී හ කුමරතුඟු මුනිදස්හු. නිවටයෝ නිවට කමට වීනා අර විදියේ කමකට කැලමැ නුසුදුසු වෙති. බැරි ද අපේ නිවට කම් ගසා පලවා - ලන්නට? පිළිවනි.

කෝ එයට මඟ? අලුතින් සිතා අලුත් දැ කැනුම යි මඟ. එයට පිහිට වන්නේ කිමෙක් ද? සිය බස යි; පර බස නො වේ.

ඉංගිරිසිය ලෝ පළ බසෙකි. එය ඉහළින් මැ දත්තෝ අප අතර වෙත් මැ යි. එහෙත් විදුව, දසුන ඈඟි කෝ ඔවුන් පැ පෙළහර? හැයි මේ? සිය බස නොදන්නා නිසා යැ. ඒ නිසා බසට මුල් තැන දී ගමන් අරඹන තෙක් ඉදිරි ගමනෙක් නැති. "පාරිභාෂික" පැලැස්තර අලවා ඔපය මැකූ බසකට මුල් තැන දී ඇති තාක් ඉදිරියට යමු යි කො තෙක් හඬ තැළුවත් අප ඉන්නේ එක තැනැ මැ යැ!

* * *

> "අලුත් අලුත් දැ නො තනන ජාතිය ලොවැ නො නඟී
> හිඟා කැම බැරි වුණු තැන ලඟී ගයා මර ගී"
>
> — විරිත් වැකිය

# හෙළ බසින් යතුරු ලිවීමේ පහසුව

කුමරතුඟු හෙම්සිරි

යතුරු ලිවීම ඉතා වැදගත් කටයුත්තෙකි. මේ මෑතක් වන තුරු මේ රටේ යතුරු ලිවීම කැරුණේ ඉංගිරිසියෙන් පමණි. එහෙත් රජයේ කටයුතු සිංහලයෙන් කරන්නට පටන් ගැනුණු ද සිටැ සිංහල යතුරු ලියනය එ ද ඉංගිරිසි යතුරු ලියනය ලබා තුබුණු තැනට හිමි කම් කියන්නට වී. පළමුවෙන් මැ සිංහල යතුරු පුවරුවෙකින් යුතු වැ සේවයට පැමිණියේ "ඔලිම්පියා" වගේ යතුරු ලියනය යි. එහි 'යතුරු පුවරුව' මෙ සේ යැ.

ා ෑ ෟ 1ෘ 2" 3/ 4ඃ 5? 6_ 7ඥ 8ෲ 9ඤ 0ඍ
ඊඕ 3ෞ කඛ වභ ඉඊ රඍ ටය තථ දධ ගඝ ජඣ
x = ෛ අෂ වඡ ඩඪ නණ උඬ එඔ මඨ රෙ
පඵ යශ ( ) ?? බහ සළ ලඵ උඹ ෘ් –ෟ ෑෑ , ' f:

ඉක්බිති වැ මෙයට වඩා වෙනස් සැටි-යෙකින් සැකැසුණු යතුරු පුවරුවෙකින් යුතු වැ පැමිණියේ යැ "ඇඩ්ලර" වගේ යතුරු ලියනය. එහි යතුරු පිහිටුවා ඇති සැටියෙන් යතුරු ලිවීමේ වෙයට මඳ රුකුලක් ලැබුණ ද නො ඇවැසි අකුරු ඉනුදු ඉවත් නො වී සිටි හෙයින් හෙළ බසින් යතුරු ලිවීමේ වෙයට පුරා යුතුකම ඉටු නො වී යැ, ඉනුදු. එහි යතුරු පුවරුව මෙ සේ යැ.

8 ෑ 1= 2" 3/ 4ඃ 5√ 6_ 7? 8' 9( 0)
ෟ ෘ දධ ටය උජ ඔඖ රඨ හශ ෙ° ඩඪ ෟස –¾
'l තථ කඛ නණ අව එස වඨ මඹ යඝ ා x :
½ ¼ ෑෑ පඵ ලළ ගඝ ඊජ ඉෂ බහ සඥ ., ෑ ෑ

දූන් දූන් අලුතින් නිපැදුවෙන "ඔලිම්පියා" වගේ යතුරු ලියනය ද මේ යතුරු පුවරුවට තැන දී ඇති බැවින් පෙනෙයි මුලින් මැ පැමිණි යතුරු පුවරුවට වඩා මේ යතුරු පුවරුව වැඩි දෙනා ගේ සැලැකිල්ලට බඳුන් වී ඇති බව. මෙ සැලැකිල්ල එයට ලැබුණේ, යතුරු ලිවීමේ වෙයට මුල් යතුරු පුවරුවෙන් ලැබුණාට වඩා වැඩි රුකුලක් එ මැ යතුරු පුවරුවෙන් ලැබෙන හෙයිනි. අද මිනිසා ගේ තැත වනුයේ තමා ගේ එදිනෙද කටයුතු හැකි තරම් වෙයින්, හැකි තරම් ඉක්මනින් කැරැ-ගනිමින් ගෙවී යන කාලයෙන් වැඩි මැ පල ලබන්නට යැ. කෙසේ වුවත් වෙය අතින් ඉංගිරිසි යතුරු ලියනයට අසල් වන්නට සිංහල යතුරු ලියනය තව මැ අපොහොසත් බව මැ යැ පෙනෙනුයේ.

වෙය අතින් ඉංගිරිසි යතුරු ලියනය හා උර පහසින්නට, නැති නම් එය අබිබවන්නට හැකි සිංහල යතුරු ලියනයක් නිපැදැවියැ නොහැකි යැ යි සිතීම මුළාවෙකි. සකු – පාළි වදන්වලට අප ගේ බස අස්සට රිංගා-ගන්නට ඉඩ සැලැසීම නිසා අප ගේ හෝඩියට අමුතුවෙන් එකතු වී ඇති අකුරු රැස එ මැ වදනුත් සමඟ මැ අප ගේ බසින් ඉවත් කළ හොත් යතුරු ලිවීම කො තරම් පහසු වේ ද? අප ගේ හෝඩියේ අකුරු අඩු කිරීම පිණිසැ න, ණ, ල, ළ, බෙය නැති කරන්නට දඟලන රීනියා හිංගල උගතුන්, බසට බරවා බඳු සකු, පාළි වදන් එ වදන් ලිවීමට අප ගේ බසට අමුතුවෙන් එකතු වී ඇති අකුරුත් සමඟ මැ ඉවත් කිරීමට නොසිතන්නේ ගියනුගියාවට ආ වැඩීමෙන් ඉවත් වීමට ඇති හුඹස් බිය නිසා යැ යි හඟිමි.

සකු, පාළි වදන් ලිවීම පිණිසැ අපේ බසට අමුතුවෙන් එකතු කැරැ-ගෙනැ ඇති මහ පණ අකුරු, හෙළ බසට බරවා බඳු ඒ සකු පාළි වදනුත් සමඟ මැ ඉවත් කළ කලැ

ඉතිරි වන අකුරු දෙ තිස යතුරු ලියනයට සුදුසු හැටියට පෙළ ගසා ගත් විටැ යතුරු ලිවීමේ වෙය මෙයට වඩා කො තරම් වැඩි වේ ද? අ,ආ, ඇ, ඈ, යන අකුරු සතර සඳහා යතුරු ලියනයට ඇතුළු වන්නේ එක මැ අ යන්න යි. ඉ, ඊ, අකුරු දෙක මැ ඇතුළත් වෙයි. උ, ඌ අකුරු දෙක සඳහා යතුරු ලියනයට ඇවැසි එක මැ උ යන්න යි. එ, ඒ දෙක සඳහා ද එසේ මැ යි. ඔ, ඕ දෙක සඳහා ද එක මැ ඔ යන්න පමණි. මෙ නයින් යතුරු ලියනයේ තැන් ලැබියැ යුත්තේ පණකුරු සයෙකි. අ, ඉ, ඊ, උ, එ, ඔ යන සය යැ ඒ.

බිංදුවත් සමඟ ගත් කල්හි ගණනින් විස්සක් වන ගතකුරු වෙනස් වෙනස් රූ දරන හෙයින් ඒ විස්සට මැ වෙන වෙන මැ තැන් දියැ යුතු වෙයි. ඔ යන්න හා එ යන්න අමුතු රූ දරන හෙයින් ඒවාට ද වෙන වෙන මැ තැන් දියැ යුතු වැ ඇති. ඊ, ඞ, දෙක ද යතුරු ලියනයේ වෙන වෙන මැ තැන් ලැබියැ යුතු යැ. දැන් සියලු අකුරු ගණන 30 කි. මේ අකුරු හා යෙදෙන පිලි ද යතුරු ලිවීමේ දී වෙන වෙන මැ අකුරු හැටියට සැලැකෙන හෙයින් ඒවා ද යට කියැවුණු ගණනට එකතු කළ යුතු වෙයි.

දැන් මුළු අකුරු ගණන 44 කි.

මේ අකුරු 44 යතුරු ලියනයට ගැළැපෙන පරිදි පෙළ ගස්වා යතුරු පුවරුවක් යොද ගත හොත් ඉංගිරිසි යතුරු ලියනය ද පරදවා හෙළ බසින් යතුරු ලිවීම කළ හැකි වනු නිසැක යැ. ඉංගිරිසි හෝඩියේ ඇති අකුරු ගණන 26 ක් වුව ද ඒ එක් එක් අකුර ලොකු කුඩා විසින් බෙදී යතුරු ලියනයට ඇතුළු වන මුළු අකුරු ගණන 52 කි. අපේ යතුරු ලියනයේ යෙදියැ යුතු අකුරු ගණන 44 ක් හසුරුවන්නට නොහැකි යැ යි සිතන්නට කරුණු නැති.

මේ අකුරු 44 න් යතුරු ලිවීමේ දී තව ද පහසුවෙක් වෙයි. මේ බලන්නැ. පාඨශාලාව යනු වෙනුවට යෙදෙනුයේ පාසැල යන්න යි. යතුරු ලිවීමේ දී වැදීම් හතරෙක් අඩු වෙයි එ තැනැ මැ. මෙ බඳු තැන් කොතෙක් ද?

1. පෞද්ගලික (යතුරු ලිවීමේ දී වැදීම් 9 යි)
2. නෂ්ටාවශෙෂ ( ,, ,, ,, 9 )
3. ආණ්ඩුව ( ,, ,, ,, 7 )
4. සම්පූර්ණ ( ,, ,, ,, 7 )
5. අවස්ථාව ( ,, ,, ,, 7 )
1. තැනැති (වැදීම් 6 යි )
2. නටබුන් ( ,, 6 )
3. රජය ( ,, 3 )
4. සපිරි ( ,, 5 )
5. විට ( ,, 3 )

සකු වදන ලිවීමේ දී හෙළ වදන ලියනවාට වඩා අකුරු ගණනින් අඩු වන තැන් ද නැත්තේ මැ නො වේ. (නිද: ක්‍රමය – පිළිවෙළ) එහෙත් ඒ ඉතා මඳ විසිනි. ඒත් පොල් තැරිය, "නාරිකේල මණි බද්ධ පුෂ්ප චක්‍රය" කරන්නට, බිම් ගෙය, "අන්තර් භෞමාගාරය" කරන්නට කැස කවන උගතුනට නම් මෙ සේ කියනු ඇසීමත් කන් දෙස් කිරියාවක් වියැ හැකි යි. අපි කුම් කරමු ද?

තව ද විමැසියැ යුත්තෙකි. සකු පාළි වදන් අප ගේ බසින් ඉවත් කළා යැ යි කියමු. එහෙත්, "ලුවිස් සිඤ්ඤෝ" "ශාන්ති කුමාර්" "ඥනසේන" ඈ සන් නමුවක් ලියන්නට වූ තැනෙකැ දී එය ලියන්නේ කෙසේ ද? එය එ තරම් අමාරු නො වේ. ඉංගිරිසියේ ඇති අකුරු විසි හයෙන් මේ කටයුත්ත කළ හැකි නම්, අපේ අකුරු දෙ තිසෙන් ඒ කාරිය කරන්නට බැරි වීමට කරුණු නැති.

ඉංගිරිසියෙන් "Khrushchev" යැ යි ලියා "කෘෂෙෆ්" යැ යි හඬවමු. Karlsrhue" යැ යි ලියා "කා(ර්)ල්ෂු" යැ යි හඬවමු. ඇත්තෙන් මැ සද දහමට අනුවැ නම් එ වදන් එ සේ හැඬැවියැ හැකි ද? ඒ පිළිගත් පිළිවෙළෙකි. එ වදන් හැඬැවෙනුයේ ඒ පිළිවෙළට අනුවැ යැ. අපි දූ එ බඳු පිළිවෙළක් පිළිගනුමු. ඉංගිරිසි අකුරින් පාළි වදන් ලියැවෙන හැටි

බලන්නැ. "පඤ්ඤා පදීප ජලිතො ජිතවා මුනින්දෙ—තං තෙජසා භවතු තෙ ජය මංගලානි" යන්න ඉංගිරිසි අකුරින් ලියන්නේ මෙ සේ යැ.

  //        –        –        –        .  –
"Panna padipa jalito jitava munimdo-

  .   –   –      –      .  .–
Tan tejasa bhavatute jayamamgalani

මේ අකුරු හා යෙදී ඇති / – ඇ ලකුණු, ඉංගිරිසි බසේ දී ඒ ඒ අකුරට හිමි හඬ අත හැරැ, පාළි බසින් හැඬැවියැ යුතු හඬට හිමි කරවයි. එ හෙයින් යටැ කියැවුණු ලුවිස් සිඤ්ඤො, ශාන්ති කුමාර්, ඥාන සේන, ඈ සත් නමු ලිවියැ යුතු තැනැ දීත්, සකු පාළි වදන් නො ලියා මැ බැරි වන වෙනත් තැන්-වලැ දීත් ඉංගිරිසි අකුරින් පාළි ලියන පිළිවෙළට අප ගේ අකුරු හා යෙදියැ යුතු ලකුණු පිළිවෙළක් පිළිගැනීමෙන් ඒ අඩුව පිරිමැසෙයි. තිත . කෙටි ඉර- සමාන ලකුණ= එකතු කිරීමේ ලකුණ + වැඩි කිරීමේ ලකුණ × ඈ ලකුණු හැම යතුරු ලියනයකට මැ පොදු බැවින් මේ පිළිවෙළින් අප ගේ යතුරු ලියනයේ අකුරු ගණනට වන අමුතුවෙක් නැති.


# ඔබ ගේ හඟවිව

තුවනත් තුවණත් අදින සේ
පල කරවා-ගන්නට නම් දෙන්නැ

# එඩියට.

| | |
|---|---|
| පසු පිටෙහි වරකට | රු. 150.00 යි. |
| ඇතුළ ,, ,, | රු. 100.00 යි. |
| ඇතුළ පිටු ½ කැ ,, | රු. 50.00 යි. |
| ඇතුළ පිටු ¼ කැ ,, | රු. 25.00 යි. |

විතර සඳහා සකසුවන් විමසන්නැ.

ගල්කිස්සේ, හුළුදගොඩ පාරේ 20/1, එඩියෙහි සකසුවෝ.

# නා - මුගටි සටන

තිරිකුණාමලේ, මුත්තුරුවේ, රජයේ මැදි විදුහලේ
ඇ. ලොරන්සු රණසිංහ

1. වත්ත පහළ ඇසෙන
සර - බර හඬෙකි. කිම ඒ?
රූ නම් නො ඇඳිණි ම - නෙත.
හඬ තව මැඩැ - ලයි සවන්.

2. බූ, පිසස් වෙති ලොවැ.
ඒ ඇදැහුම නොගත් මා
මහ දවල් බිය ගත්වා -
ලන්න ද තැත් කවන්නේ?

3. 'සූ සුසුස් සූස්' හඬ
මා අමතයි නැටුමකට.
දෙ පය මා ගෙනැ පෙරට මැ
ඇදෙයි දකිනුව විසිතුර.

4. උණ ගසක් පමණට
වට පමණැති නා රජෙකි,
ලොකු කැන්ද කොළයක් සා
සුදු පෙණ ගොබය නටවන!

5. රියනකට අඩු නැති
දඹුවක් හා නොවැ හබය!
දඹුව ද සපණ බව පා
පසු කොන තදින් කෙළවයි.

6. ම - ඇස රැවැටුණු බව
'දඹු රියන' තිර කොටැ දැනැ
නයි හාමි කෙළවන සේ
සිය හපන් කම් පෙන්වයි.

7. දත් හැම හපන් කම්
එක විටැ මැ නො මැ පෙන්වා
නිසි ලක බලමින් හොඳින්
විටැ විටැ නයා බැට දෙයි.

8. "තට පෙණය මට රොම්"
කියනෙ'ව් ඒ හැම පුප්පා
කරණම් ගහන මෙ දඹුව
මුගටියෙකි මා රැවැටූ!

9. තුරුණු මුගටි තෙමෙ ද
එ අත මෙ අත පැනැ තදින්
පහර දී, වැළැකී ඉන්
දක්වී යුද පුරුදු සේ.

10. ඇත ද සුදක් ඉහළ
යුද නවතනු රිසි නො වේ.
නය, නරයත් හට අයත්
තිරිසන් ලොවැ නො සැලැකේ,

11. පසු නොබසින්නෙමැ යි
දැඩි අදිටන පණන සේ
ඉහළ පහළ ගොස් කොවින්
දෙන නයි පාරත් දැඩි යි,

12. නැඟිණි යළිත් පෙණය
ලෙළ විදිලියෙ'ව් එ සැණය
එ මත හිඳි මුගටි හෙණය
බිමැ හොත්තේ නයි කුණ ය!

13. ම - හද බඳු ගත් රස
පලා ගිය සැටි එ විගස!
ගතින් කුඩා වුවද කිස
නුකුඩා යැ ඇත හොත් හිස

(පහිණ හදරුවට එවුණු පබඳෙකි.)

# මගේ බලපිටි සමය – 2

මොහොට්ටි දෙණු දේවිදු

**බ**ලපිටියේ සිදුහත් ගුරු ඇබෑසි විදුහල් පිවිසුම් විබෙදුව පැවැත්වෙන දිනය දක්වුණු හස්න පැමිණියේ යැ. එ හස්නෙන් දතිමි, කලින් සැළ වූ පුවත සැබෑ බව. එ නම්: **කුමාරතුංගයන් නිට්ටඹුව පියා, බලපිටියට පැමිණෙන බව යි. කුමාරතුංග මුනිදසයන්** එහි විදුහල් පති ලෙස සිය අස්සන යොද තිබෙනු දකැම හද පිනා – ගියේ යැ. දූන් ඉතින් මගේ අදහස පලවත් වීමට නම් පිවිසුම් විබෙදුවෙන් සමත් වුව මනා මැ යැ.

විබෙදු දිනය හෙට යැ. එ සඳහා යා යුතු බලපිටියට යැ. ගමෙ සිටැ – **රත්සැගොඩ කොරඹුරුවානෝ** සිටැ, සූ සැට මයිලයෙකින් ඔබ්බෙහි යැ එ පිහිටියේ. එ හෙයින් අද පස් වරුයෙහි එහි ගියෙමි. පසු දින මුළු මනින් මැ විබෙදුවට ඇරුණේ යැ. ලිවීමෙන් පිරික්සුමෙ වැඩ කැරෙන අතර මැ එක් එක් තැනැත්තා වෙන් විසින් කැඳවා අබි– මුවෙහි පැන ඇසීමේ පිරික්සුම ද කැරුණේ යැ, එය කැරුණේ **කුමාරතුංග මුනිදසයන්** විසිනි.

**කුමාරතුංග මුනිදසයන්** පළමුයෙන් මැ මට දක්නට ලැබුණේ එද යැ, ඔහු සැමැනි මිනිසුනට වඩා උස මහතින් යුතු යැ. එ ද උසට සරි ලන මහත යැ, මහතට සරි ලන උස යැ. කළු යැ, තර යැ, වමරැ'සි යැ, හිසැ කෙස් ඉතා කොටට ලියැවුණේ යැ. වම් පසට මඳ වන සේ හිසැ කෙස් පීරා බෙදුණේ යැ, කළු උඩ රවුළින් යුතු යැ – බස රළු යැ, පැහැදිලි යැ, තද යැ, හැඳුම ඉංගිරිසි යැ. දුඹුරු වන් කලිසමක් ද, සුදු කමීසයක් ද පැහැපත් ටයි පටියක් ද, පසු කබායක් ද හැඳැ ඒ හැමට ගැළැපෙන සේ කබායෙකින් ද සැරැසී සිටිය හ එ ද නම් ඔහු. වෙස දකුම් කලු වුව ද නුපුරුද්දනට එක් වර මැ බිය දනවන සුලු යැ. ඒ හා මැ මට සිහි වූයේ,

"වෙසෙසින් පහන් පැහැසර
ගැඹුරු පිවිතුරු
බැලුවන් ඇලුම් කරවන
යළි දු බියකරු
සිරි පින් රුවන් පිරි එ සුරිඳු
සයුරු යුරු
මුවෙකින් කියා නිමැවියැ
හැකි ද රූ සිරු.?"

යන පැදිය යි. මේ කියවන ඔබ මා කෙරෙහි නොදහන්නැ, "හුදු දෑ – ඇල්මෙන් පිපුණු හදක් ඇති **කුමාරතුංග මුනිදසයන්** හා අර 'දෑ – බරටුවා' හා මොහොතකට හෝ සැසැඳූ හ"යි. කමන්නැ එ බන්දක් නො කෙළෙමි මම. **කුමාරතුංගයන්** ගේ වෙස දක්නා විටැ අර පැදිය මතක් වීමෙ වරද පමණි ම – ගෙන් වූයේ. එ ද සිහි ඇති කමෙ වරද මැ යි. දක්මේ ආසාව බලවත් වැ පැවැති නමුදු ඇසුර එ සා මිහිරි වෙති යි නොසිතුණේ යැ, එ ද නම් මට. වයස හවුරුදු පන්සාළිසක් පමණ පෙනුණ ද දකින සඟළක් පැළැඳි බවක් නො දිටිමි.

හමු පිරික්සුම විටෙහි මගේ වාරය ද පැමිණියේ යැ, පැන – පත්වලට පිළිතුරු සොම්නසින් ලියුව ද, වෙතට කැඳවා තනි වැ කැරෙන මේ පිරික්සුමෙ දී, මගේ නම්වර කියැවෙත, එ ද තැති ගැන්මක් ඇති වූ බව නම නොකැමැත්තෙන් වුව ද කියැ යුතු යැ. පිරිමි දිරිය උපදවා – ගෙනැ ගියෙමි කිළියක් තුළට. එහි හුන්නෝ **කුමාරතුංග මුනිදසයෝ** යැ. ම ගේ නම ගම වයස උගැන්ම, ගුරුන්, සහතික පත් ඈ හැම

තැනැති තොරතුරක් මැ විමැසීමෙන් පසු පත පොත දැනුම පිළිබඳ කරුණු ද පිරික්සූ හ. පළමු කොටැ කවියක් කියන්නැයි කී හ **කුමාරතුංගයෝ**. මම,

"ත ර ස ර සුනෙර තද තෙද
　　　　දිමුතු දිවයුර
පු ව ත ර ගැඹරැ සමුදුර
　　　　කැලුමැ නිලඹර
සොම්බර පවර නිසයුර
　　　　නුවණැ සුරගුර
සු ර ව ර සැරද විබිසණ
　　　　නම් කැළණි පුර"

යනු ගැයිමි.

**ගීයක්?**

"කලුන් කත් මහනෙල්
ගෙල් ලැබැ වැට මැඩුණ ද
මන දෙළ පිරී පියන්
රසනැ මිණි මෙරජ රජ"

යනු ගැයිමි.

**ශ්ලෝකයක්?**

"වෘක්ෂං ක්ෂීණ ඵලං ත්‍යජන්ති
　　　　විහගා දග්ධං වනාන්තං මෘගාඃ
නිර්ගන්ධං කුසුමං ත්‍යජන්ති භ්‍රමරාඃ
　　　　ශුෂ්කං සරං සාරසඃ
නිර්ද්‍රව්‍යං පුරුෂං ත්‍යජන්ති ගණිකාඃ
　　　　දුෂ්ටං නෘපං මන්ත්‍රිණඃ
සර්වේ කාර්ය වසාජ්ජනානු පදිකඃ
　　　　කඃ කස්‍ය කිං වල්ලභාඃ"

යනු ගැයිමි.

ඉක්බිති හැම එකෙකින් මැ පැන කිහිපයක් ඇසූහ. මට එ කලැ දනට වඩා හඩ නහවා ගැයීම කළ හැකි හෙයින් අවසනට ගැයුණු සකු සිලොව හොඳට ඇදැ-පැදැ ලෙලවා මහත් වෙයින් ගැයිමි. දනට බුලත් විට මඳ වියින් සපන නමුත් ඒ අවදියේ දිනපතා මැ බුලත් විට තුන-හතරක් හෝ ඊටත් වැඩියෙන් හෝ සැපීම ම-ගේ සිරිත වියැ. දතේ රැඳී පැවැති බුලත් කසට මැනැවින් පෙනුණේ සිලොව ගැයීමේ දී යැ. ඒ දුටු **කුමාරතුංග මුනිදසයෝ** ඇසූ හ. මම පිළිතුරු දිනිමි.

"බුලත් කනවා ද?

"ඔව්"

"දවසට විට් කියක්?"

"දෙකක් තුනක්."

"නැතුව බැරි ද?"

"බැහැ නැතුව මැ."

"කිසි සේත් මැ?"

"අඩු කළ හැකි අමාරුවෙන් වාර ගණන.?

"ඒ කෙ සේ ද?"

"රැට පමණක් කෑමෙන්."

"රැට මැ ඒ දෙක-තුන?"

"නැ, එකක්.

"ඒ එකත් අර දෙක-තුනට මැ හරි යන්න?"

මම නිහඬ වීමි.

හොඳ යි, කිසියම් ලෙසෙකින් විදුහලට ඇතුළු වූ හ යි සිතමු. ඊට පසු නම බුලත් සැපීම හෝ දුම් බීම හෝ නොකරන්නට මැ තරයේ සිතට ගත යුතු. එ ද නො සලකා අණ උලැඟිය හොත් විදුහලින් නෙරැපෙන බව ද දත යුතු යැ යි මා දන්වා, ඊ ළඟැ නම්වර ඇති තැනැත්තහු බැණැවූ හ **කුමාරතුංග-මුනිදසයෝ**.

එ ද මේ පිරික්සුමට ඉදිරි පත් වූ ගුරු මහතුන් ගෙන් කිහිප දෙනෙක් සිටිය හ කොංඩය බැඳි. "විදුහලට ඇතුළු වුව හොත් ඔය ශීර්ෂාභරණ ගෙදරැ තබා එන්නට මතක තබා-ගත යුතු යැ"යි ඔවුනට දැන්වූ බව ද පසු වැ දනිමි මම ඔවුන් ගෙන්. පිවිසුම් විබෙදුවට පෙනී සිටි දෙ වගෙහි මැ (පුම්'තිරි) අය පන්සියයක් පමණ වූ හ. පස් වරු පහ හමාරට පමණ පිරික්සුමේ කට යුතු නිමුණේ යැ. ඉක් බිති හැම දෙන මැ අමතා,

කුමාරතුංග මුනිදසයෝ දෙසුමක් කළ හ. ඒ දෙසුම මුළු මනින් දැන් මට නොමතක යැ. එහෙත් සැකෙවි හරවුව මෙ සේ යැ.

"මේ පරීක්ෂණයට පෙනී සිටි ඔබ හැම දෙන මැ එහි කට යුතු තම - තමන් ගේ ශක්ති ප්‍රමාණයෙන් විද්‍යාලයට ඇතුළු වීමේ අපේක්ෂාවෙන් මැ කළාට කිසි සැක - යෙක් නැති. එ සේ මැ, පරීක්ෂණයෙන් ඉතා උසස් ලෙස සමත් වුවත් මැ සෑහෙන ගණනක් විද්‍යාලයයේ ඉඩ ඇති පමණට ඇතුළු කැරැ - ගන්නා බව ද සැලැකුව මැනැවි. මෙ විද්‍යාලයය ආරම්භ කළ, අධිකාරි තැන් පත් මේ **ගරුමුනි රොබත් ද සොයිසා** සූරින් ගැනැ ද බසක් කියැ යුතු යැ. විද්‍යාලයය ආරම්භ කොටැ, ගත වූයේ මසකට නොවැඩි කලක් වුව ද, මෙ තෙක් අන් කවරකු විසිනුදු නොකළ සේ එය රජයෙන් පිළිගැණුණක් කොටැ, ඔහු මහා ප්‍රාතිහාර්යයක් කළ හ, කල් යත් යත් ඔවුනට පුරුදු එබ දූ ප්‍රාතිහාර්යයන් යමක - යමක වශයෙන් කැරෙනවාට කවර සැකයෙක් ද! එ සේ මැ කිරීමට ඔවුනට සර්ව ප්‍රකාර- යෙන් මැ ශක්තිය ලැබේවයි අපි ප්‍රාර්ථනය කෙරෙමු. මේ පැමිණි ඔබ හැම ගේ අදහස් සාක්ෂාත් කැරැ-ගැනීමට ද හැකි වේ වා."

මෙ සේ දෙසුම නිමුණු පසු හැම දෙන මැ තම - තමන් ගේ ගම් පෙදෙස් බලා යැමට හැරුණ හ. මම එ දිනැ **බළපිටියේ** මැ නැවැතී පසු දිනැ උදේ ගම් බලා ආයෙමි.


# පහිණ හදුරුව

**කවි තැනීම** - අවුරුද්දෙකින් උගන්නට ඔබ කැමැති ද? එ සේ නම් **අරිසෙන් අහුබුදු** අරඹා ඇති කවි හදුරුවට බැඳී, සතිපතා පැටුම් ගෙන්වා, එහි ඇබැසිවලට පිළිතුරු ලියා එවා ඔහු ලවා මැ නිදෙස් කරවාගන්නැ. මසකට පැටුම් 4 කි; අවුරුද්දකට 48 කි.

**අය කිරීම** - මසකට රු. 5.00 කි. දෙළොස් මසට මැ මිල එක් වරැ එවතොත් රු. 10.00 කැ ලාබයෙක් ද ඔබට ලැබෙ.

අවුරුද්දෙකින් කිවියකු වීම මැ කො තරම් ලාබයෙක් ද?

**දෙවු (G. C. E) ගණිතය** - දෙවු සෝදිසියේ නිසැක ජය ඔබ සොයා එන්නට සැරැසී සිටී. ඔබ කළ යුත්තේ **ලියනගේ ජිනදස්** ඇරැඹූ දෙවු ගණිත පැටුම් පෙළ සතිපතා ගෙන්වමින් එහි ඇබැසි විසඳා එවමින් ඔහු ලවා මැ දෙස් නිදෙස් කරවාගැන්ම යි.

**අය කිරීම** - මසකට රු. 10.00 කි. පැටුම් 48 ට මැ මිල එක් වරැ ගෙවතොත් රු. 100.00 කි.

**අරිසෙන් අහුබුදු**
**ලියනගේ ජිනදස්**

**ගල්කිස්සේ හුළුදගොඩ පාරේ 20/1**

# මල් ගුළාව

ගල්කිස්සේ
චන්ද්‍රා ආශුබෝධ

ලස්සන ලස්සන
කුසුම් වැලැඳැගෙනැ
මල් ගුළාව ගෙයි
මුල් තැනැ සිටියා.

නො වී යැ ඔහු මෙන්
තොසින් වෙසෙන්නෙක්.
දිනය ඔහුට මල්
හා මැ අලුත් වෙයි.

කලෙක් ගෙවිණි; ලෝ
දමේ අඳුරු පස
උද වුණා, හේ
කාටත් පිරිහිණි.

වත්ත පිටිය අතු -
ගා කුණු අමදින
මෙහෙකරුවිය ගෙන්
පවා ලැබෙන්නේ -

ඉදල් පහර මැ යැ.
අවසන් ගමනත්
ගොසින් සැතැපුණේ
වත්තේ කොනෙකැ යැ

+　　+　　+

අළු කිස
ඉවර යැ.
කෝ අර
මල් දම්!

+　　+　　+

# සොබා දහම

අනුරාපුර
අරිසෙන් විජයගුණසේකර

කැකුළෙක් පිපී පර වී
　　　　මැලැවී　　යනවා
එ නමුත් මල් පඳුර
　　　　පෙරැ සේ　　පවතිනවා

සිනා පා මහලු කුසුමට
　　　　යොවුන්　　මල
ඉනා සුවඳ දී කැඳවයි
　　　　බමර　　කැල

මළ මල ගිය දවස
　　　　සිහි කැරැ මේ　　කීයේ
''ඔය කල මට ද
　　　　තිබුණා නොවැ සකි ඊයේ''

**කල් ගමන.**

මවු ගස පියා සෙද
සුළඟින් පැමිණි බිජුවට
තෙත පස සමඟ මුසු වී
කුඩා පැළයෙක් ඇති විණි

හිරු එළිය වැටුණා
කලට නිසි වැසි වැටුණා
පොහොරේ සරුව ලැබුණා
මවු ගස බවට හැරුණා.

+　　+　　+

[පහිණ හදරුවට ලියැවුණු ඇබෑසියෙකිනි.]

# ලක් ඉතිහසට රුකුල - 4

කමල් තිලක

[පොදු සහතික පත් (*G. C, E.*) සෝදිසියට සැරසෙන්නවුන් සඳහා යැ. සටහන් විසින් දිගට පළ වෙයි.]

බ්‍රවුන්රිග් (1812 – 1820)

(1) අදහස්.

i. සුදුසු අවසරයක් එළැඹුණ හොත් මහනුවර අල්ලාගැන්ම - මේට්ලන්ඩ් යටතේ ඉංගිරිසි ආධිපත්‍යය තිර වූ හෙයින්.

ii කන්ද උඩ රටට පහර දීම යුක්ති සහගත කිරීමට හේතුවක් ලැබෙන තුරු බ්‍රවුන්රිග් සිටියේ ය.

(2) අධ්‍යාපනය.

i. ක්‍රිස්තියානි ශුභාරංචි ධර්ම ප්‍රචාරක ව්‍යාපාරය නිසා ඇති වූ උද්යෝගය වැඩි දියුණු කිරීම සඳහා බ්‍රවුන්රිග් තෙමේ පාසල් ගණනාවක් මැ තැනැවී

ii. ලංකාවේ නොයෙක් පෙදෙස්හි පාසල් දෙළොසක් පමණ පිහිටැවූ හෙතෙම, එහි වැඩට වැස්ලියන් මිෂනාරිවරුන් යෙදී ය.

iii. ලංකාවට පැමිණි නොයෙක් මිෂනාරි සමාගම් මඟින් පාසල් අරඹන ලදි.

**(3) මහනුවර සමඟ කටයුතු.**

i. උඩරට කැරැලි කරුවෝ ඉංගිරිසි පෙදෙස්වලට පලා එන්නට වූ හ. ඔවුන් ලුහු බැඳැගෙන ආ සිංහල හේවායෝ ඉංගිරිසි පෙදෙස්වලට ඇතුළු වූ හ; (1815) පැලකට ගිනි තැබූ හ.

ii. මුස්ලිම වෙළෙඳුන් දස දෙනක් චර පුරුෂයන් ලෙස සැලැකූ උඩරැටියෝ ඔවුන් අංගච්ඡේදය කොට ආ පසු එවූ හ.

iii. 1815 ජනවාරි 11 - උඩරටට පහර දී ම.

iv. 1815 මාරතු 2 - කන්ද උඩරට යටත් විය.

v. ගිවිසුම.

(අ) සිහසුනට මලබාරයන් ගේ අයිති වාසි කම් නැති විය.

(ආ) පාලනය බ්‍රිතාන්‍ය රජුට පැවැරිණි.

(ඇ) නායකයන් ගේ අයිතිවාසි කම් පවත්වා - ගෙන යෑමට සහ සිංහල සිරිත් විරිත් අනුව රට පාලනය කිරීමට ඉංගිරිසීහු එකඟ වූ හ.

(ඈ) බුදු දහම ආරක්ෂා කිරීමට ඉංගිරිසීහු එකඟ වූ හ.

**(4) උඩ රට ඇල්ලීම සාර්ථක වීමට හේතු.**

i. මෙ තෙක් අසාර්ථක වූයේ ස්වාභාවික රක්ෂාවරණය හා වැසියන් ගේ රාජ පාක්ෂික භාවය නිසා ය.

ii. මහනුවර රජ මෙ කල රට වැසියා ගේ අප්‍රසාදයට ලක් විය;

**හේතු:-** (අ) සිය නායක්කර වාංශිකයනට මුල් තැන දීම හා සිංහල නායකයන් ගේ අවවාද නොතැකීම.

(ආ) කැරැලි කරුවන් ලෙස සැක කළ නායකයනට දරුණු වද දීම - සමහර විට ඔවුන් ගේ පවුල්වලට පවා.

(ඇ) සංඝයා ගේ සහාය නායකයනට විය. සැක සහිත වූ සංඝයා වහන්සේ ද මරනු ලැබූ සේක. නාථ හා මහා දේවාල අතර ශුද්ධ භූමියේ දී ඇතැම් මරණ සිදු කිරීම අප්‍රසාදය වැඩි කෙළේ ය.

(උදා:- මොරතොට කුඩා උන්නාන්සේ ගේ මරණය)

(ඈ) තමන් ගරු කළ සිංහල නායකයන් හා සංඝයා තළා පෙළනු දුටු රට වැසියෝ රජුට විපක්ෂ වූ හ.

(ඉ) ජන ප්‍රිය වීමට රජු ගත් තැත සපල නො වී.

(ඊ) රටේ කැරැලි අඩු කිරීමට වැසියනට වැඩි වැඩ පවරන ලදි. ඔවුහු ගමින් ගමට මාරු කරනු ලැබූ හ.

iii. රදළවරු බ්‍රවුන්රිග් හා එකතු වූ හ.

(අ) ඇහැලේපොළ පළමු ව උදවු ඉල්ලූ නමුදු නෝත්ව සිදු වූයේ නිසා බ්‍රවුන්රිග් එකතු නො වී ය.

(ආ) රජුට ඇති විරුදු බව ඉංගිරිසිනට ඒත්තු ගැන්වීමට ඇහැලේපොළ විසින් මෙහෙයන ලද කැරැල්ල අසාර්ථක විය.

(ඇ) ඇහැලේපොළ බ්‍රිතාන්‍ය පෙදෙසට ආවේ ය.

(ඇ) තුන් කෝරළයේ හා සතර කෝරළයේ, රජුට විපක්ෂ නායක පවුල් ඉවත් කිරීමට තැත් කිරීමෙන් නායකයෝ විපක්ෂ වූ හ.

(ඉ) ආක්‍රමණ අවස්ථාවේ දී රජු ගේ පළමු අදිකාරම් මොල්ලි ගොඩ පවා රජු අත් හැරියේ ය.

## (5) 1817 – 1818 උඩරට කැරැල්ලට හේතු.

i. නායකයන් ගේ අප්‍රසාදය:-

(අ) පහත රටට නුදුරු පළාත්වලැ සිටි රදළයනට දේශ සීමාවේ දී වෙළෙඳුන් ගෙන් ගත් තීරු බදු නැති විය.

(ආ) කුල බේදය ගැන නො තැකූ බ්‍රිතාන්‍යයෝ, ඒ අනුව නඩු විසැඳීමට ඇකැමැති වූ හ.

(ඇ) පෙර රජ තුමාට පමණක් යටත් ව සිටි රදළයනට බ්‍රිතාන්‍ය නිල දරුවෝ ද අණ දුන් හ.

(ඇ) රට වැසියා ගෙන් ලැබුණු ගරු බුහුමන බ්‍රිතාන්‍ය නිලදරුවන් ගෙන් රදළයනට නොලැබුණේ ය.

(ඉ) මලබාර පාලකයන් පහ කොටැ, අයින් වියැ යුතු පිරිසක් මිස මෙහි පාලකයන් වියැ යුතු පිරිසක් ලෙස රදළයෝ බ්‍රිතාන්‍යයන් නො සැලැකූ හ.

ii. සංඝයා ගේ අප්‍රසාද ය.

(අ) මෙ තෙක් කල් බුදු දහම පාලන ක්‍රමය හා බැඳී පැවැතිණි. එයින් බුදු දහමට සුදුසු තැන හිමි විය. දැන් එය නැති විය.

(ආ) රජු ගේ ගරු බුහුමන ලැබූ සංඝයා වහන්සේට බ්‍රිතාන්‍යයන් ගේ ගරු බුහුමන් හිමි නො වී ය.

(ඇ) ඉංගිරිසි පාලනය යනු ක්‍රිස්තියානි පාලනය බව සංඝයාට අවබෝධ විය.

(iii) වැසියන් ගේ අප්‍රසාදය.

(අ) සිය නායකයනට හා සංඝයාට නිසි තැන් නොලැබෙනු දුටු කලැ වැසියෝ අසතුටු වූ හ.

(ආ) කුල භේදය අනුව හැඩ ගැසුණු ඔවුහු නව පාලන ක්‍රමයට ඇකැමැති වූ හ.

(ඇ) විදේශිකයකුට යටත් වීම නිසා සිය ජාතිකාභිමානයට පහරෙක් විය.

(ඇ) බ්‍රිතාන්‍යයෝ ස්වකීය තත්ත්වය දියුණු නොකොළෝ ය.

(iv) වෙල්ලස්සේ විදනේ පදවිය.

(අ) සිංහල රදළයන් ගෙන් බේරී සිටීමට සිතූ මුස්ලිම්හු වෙල්ලස්ස පෙදෙසට යෝනක විදනේ කෙනකු ඉල්ලූ හ

(ආ) වැඩි දෙනකු සිංහල වූ මේ පෙදෙසේ යෝනක විදනේ කෙනෙක් පත් කරනු ලැබූ හ.

(ඇ) ඌවේ හා වෙල්ලස්සේ වැසියෝ කැරැලි ගැසූ හ.

(v) කිරීටයට හිමි කම කියන, විල්බාවේ නමැත්තා ඉදිරිපත් වූ කලැ කැරැලි කරුවෝ ඔහුට එක් වූ හ.

**(6) කැරැල්ල පිළිබඳ ව.**

i. වනගත ව සිටැ, සිංහලයෝ ඉංගිරිසීනට පහර දුන් හ.

ii. නායකයෝ වැඩි දෙනෙක් ඉංගිරිසීනට විපක්ෂ වූ හ.

iii. ගෙවල් ගිනි තැබීම ආදියෙන් මෙය මැඩ පැවැත්වීමට ඉංගිරිසිහු සිතූ හ.

iv. කොතරම් කැරැල්ල දරුණු වී ද යත්, මහනුවර අත් හැර යැමට බ්‍රවුන්රිග් සිතී ය.

v. එහෙත් ඉංගිරිසීන් ගේ වාසියට කරුණු සැලැසුණේ ය.

**7. කැරැල්ල අසාර්ථක වීමට හේතු.**

i. කැරැලි කරුවන් ගේ සංවිධානයක් නො මැති කම - තැන් තැන්වල නොබැඳුණු කැරැලි කිහිපයෙක් ඇති විය.

ii. කැරැලි නායකයන් ගේ අසමගිය - එක් නායකයෙක් ඔවුනට නො වී ය.

iii. සතර කෝරළයේ අදිකාරම් වූ මොල්ලිගොඩ බ්‍රිතාන්‍යනට පක්ෂ වීම - කොළඹ හා මහනුවර අතර සම්බන්ධතාවය රැකුණේ ය.

iv. මහනුවරට ආහාර ලැබීම වළක්වා රට වැසියෝ අවනත කැර - ගනු ලැබූ හ.

v. සෑහෙන තරම් බළ සෙනඟක් පළමු ව නොවූ බ්‍රිතාන්‍යයනට ඉන්දියාවෙන් හමුද ලැබුණේ ය.

vi. විල්බාවේ පෙර රජ තුමා ගේ නෑයකු නො වන බවත් සිවුරළුවකු බවත් දැන-ගැනීම නිසා රට වැසියා ගේ උද්යෝගය අඩු විය.

vii. 1818 නොවැම්බරයේ දී බ්‍රිතාන්‍ය-යෝ දන්ත ධාතූන් වහන්සේ අල්ලාගත් හ. ධාතූන් වහන්සේ හිමි තැනැත්තා රාජ්‍ය පාලනය කළ යුතු බව වැසියෝ සිතූ හ.

**(8) 1818 ප්‍රකාශනය.**

මෙය පොරොන්දු පත්‍රයක් නො ව උඩ-රැටියන් පිටැ පැවැරීමෙකි.

i. කන්ද උඩ රට සියලු බලය බ්‍රිතාන්‍ය කිරීටයට අයත් විය.

ii. නායකයන් ගේ අන්දයම් හා බලතල නැති විය. ඔවුනට තිර වැටුපෙක් පමණෙක් ලැබිණි. ආණ්ඩු කාරයාටත්, මහල් මඩුවේ වූ ඉංගිරිසි රාජ රූපයටත් කළ යුතු ගෞරවය සඳහන් විය.

iii. වැසියන් ගේ අයිතිවාසි කම් පළ කරන ලදී.

iv. කන්ද උඩරට අන්‍යාගම් පැතිරැවීමේ බලය ප්‍රකාශ විය.

v. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ බලය තහවුරු විය. බුදු දහම තවත් පිරිහිණි.


## පරෙවිය
(සාම අසීත)

**මෙ තෙක් සිංහලයෙහි ලියැවුණු දිගුතම අසුන් කව යි.**

අරිසෙන් අහුබුදුවන් විසින් පැබැඳිණි. ලියනගේ ජිනදසුන් ගේ පහදුයෙන් යුතු යැ.

පැදි 501 යි. මිල රු. 5.00 යි.

**කොළොම්බැ, නොරිස් වීදියේ, මැකලම් පොත් හල.**

# පල බර බක් මාසේ

සුනිල් සාන්ත

පූන — ගැයිය { පල බර බක් මාසේ
හෙළ වනයේ සිරි නරඹන්නේ.

1 නන් පැහැයෙන් ගස් වැල් ලෙළදෙන්නේ,
පැහැ - කැටි දස'තැ සරන්නේ,
නන් පැහැයෙන් ගස් හෙවණ සැදෙන්නේ,
සිරි බර පල බර මාසේ.

2 අඹ දඹ කජු ලොවි පේර හිඹොටු දං,
ඇ පල දස'තැ පෙනෙන්නේ,
පළෑ පළෑ පල අවුලති හෙළ කොල්ලෝ,
හෙළ වනයේ මේ මාසේ.

3 හෙළ කොවුලෝ නිති ගී නද දෙන්නෝ,
පල බර මහ තුරු මුදුනේ,
අනෙක් කුරුල්ලෝ වනය පුරා හිඳැ,
දුවය ගයති මේ මාසේ.

| | | | |
|---|---|---|---|
| ස ග ප නි | ස̇ - ද ම | ප - - - | - - - - |
| ප ල බ ර | බ ක් මා - | සේ - - - | - - - - // |
| ස̇ රි̇ ස̇ නි | ද ප ග ම | ග ස රි - | ස - - - |
| හෙ ළ ව න | යේ - සි රි | න ර ඹ න් | නේ - - - |
| ග - රි ස | ග - ප - | ද ස̇ නි ප | ද - ප - |
| න න් පැ හැ | යෙ න් ග ස් | වැ ල් ලෙ ළ | දෙ න් නේ - |
| ප ද̇ ස නි | රි̇ ස̇ ද ම | ද - ප - | - - - - |
| පැ හැ කැ ටි | ද ස තැ ස | ර න් නේ - | - - - - // |
| ස̇ - නි ද | නි - . ද - | ප ප ග ම | ද - ප - |
| න න් පැ හැ | යෙ න් ග ස් | හෙ ව ණ සැ | දෙ න් නේ - |
| ද ප ම ග | රි ස නි ස | රි - ස - | - - - - |
| සි රි බ ර | ප ල බ ර | මා - සේ - | - - - - |

# 'පාරිභාෂික' පටලැවිල්ල

**රජයේ බස සිංහලය වූ ද සිටැ සිංහල සිප් වදන් වෙනුවට කිසි බසකට නැති, 'පාරිභාෂික ශබ්ද' යන්නෙක් සිංහලයා පිටැ පැටැවෙන්නේ යි.**

**'පාරිභාෂායෙන්'** වැඩ ගන්නට තැතැනූවෝ අවුලෙන් අවුලට මැ වැටුණෝ යි. එහෙත් **'පාරිභාෂාව'** රකින්නට සමහරු නැත් දූරු හ. උනට නිසි පිළිතුරු සපයන්නට දෝ **රජයේ විදිලි අදිකාරියත්, ලංකා මිහිතෙල් මඩුල්ලත්** සුදුසු හෙළ සිප් වදන් තනා වැඩට ගත් හ.

ඒ හෙළ සිප් වදන් හැකි තරමින් රටට දෙන්නට ගත් තැතෙකි මේ.

(ගිය කලබ හා බැඳෙ යි.)

*Relay, No-Volt* නො - වොල්ත පිළිපවරුව
*Relay, Overcurrent* ඉකුම් - දහර පිළිපවරුව
*Relay, Overload* ඉකුම්බැර පිළිපවරුව
*Relay, Reactance* පිළිකිරිය පිළිපවරුව
*Relay, Thermal* තැප්යුරු පිළිපවරුව
*Relay, Tripping* මිදුම් පිළිපවරුව
*Reluctance* පකුළුව
*Reluctance, Magnetic* යකැති පකුළුව
*Reluctivity* පැකිළියාව
*Remote control* දුරින් පැලුම
*Remote operation* දුරින් මෙහෙයුම
*Remote Supervisory systom* දුරින් සුවික්-සුම් සැටිය
*Repeat* පුනපායි (6) (පුන + පායි)
*Repeator* පුනපැවිය; පුනපැවි
*Report* සැළය; සැළ
*Report, Feasibiliiy* සපලතා; සැළය
*Requisision* විදහන
*Research* පිළියෙසුම; පිළියෙසුම්
*Research laboratory* පිළියෙසුම්; විදුගර
*Reserve* රැස්සුරයි (රැස් + හුරු)
*Reservation* රැස්සුරුව
*Reservoir* රඳාරය, රඳාර (රඳ + ආර)
*Reservoir condenser* රඳාර පෙහෙවිය
*Reservoir, Gas* ගෑසි රඳාරය
*Reservoir Mercury* රසදිය රඳාර
*Reservoir, oil* තෙල් රඳාරය
*Reservoir, water* දිය රඳාරය
*Resistance* රෝදය, රෝද
*Resistance area* රෝද පෙදෙස
*Resistance box* රෝද පැස
*Resistance – capacity coupled amplifier* රෝද පෙහෙවියා දූඳු තරයනය
*Resistivity* රෙදියාව
*Resistor* රෝදුව - රෝදු
*Resistor Current – limiting* දහර – ඉම්කුරු රෝදුව
*Re – sleeve* පිළිසිවිලයි (1)
*Revise* පිනික්සයි (1)
*Revision* පිනික්සුම
*Revolve* පිරිබමයි (2) (පිරි + බම)
*Revolving* පිරිබමන
*Revolution* පිරිබුමුව; පිරිබුමු
*Re-wind* පිළි - ඔතයි (1)
*Rewinder* පිළි-ඔතනය; පිළි-ඔතන
*Right hand rule* දකුණත් නිය
*Ring circuit* වට සැරිය
*Ripple* රැළිත්ත; රැළිති (රළ + ඉත්ත)
*Ripple voltage* රැළිති වෝල්තතාව
*Rising main* නැඟුම් මායනය, නැඟුම් මායන
*River bed* ගඟ පතුල
*Road crossing* මං තරයනය
*Road tracer* මංනුවකුව; මං-නුවකු (අනු + අක)
*Roast* පලහයි (1)
*Roaster* පලහනය; පලහන
*Rotate* බමයි (2)
*Rotation* බුමුව; බුමු
*Rotating* බමන
*Rotating machinery* බමන ගතයුරුව; බමන ගතයුරු
*Rotor* බමනය; බමන
*Rotary* බැමුම්
*Rotary screen* බැමුම් සුවැරිය (සු + වැරි)
*Rotary transformer* බැමුම් තරා පැවිය
*Rural* ගැමි
*Rural district* ගැමි දෙසිත්ත - ගැමි දෙසිති (දෙස් + ඉති)
*Rural distribution system* ගැමි බෙදැරුම් සැටිය
*Rural electrificatiom* ගැමි විදිලියනය
*Rural lighting* ගැමි එළියනය
*Rust proof* මලවරු (මල + වරු)

# එකට එක

අජිත්

[පඬු අබා සමය මැදි කොටැ ලියැවුණු දිගු අන්දරයෙකි මේ. මෙ තෙක් කතාව සැකෙවින් මෙ සේ යැ:-

**පඬුවස් දෙව්** රජ පුත්තු සිය සොහොවිරිය ගේ – **චිත්‍රාව** ගේ – පුතා වෙනුවට ආ බිලිඳියත් කිරි මවත් මරන්නට සැසැඳිලි කළ හ. එහෙත් චිත්‍රාව එ රහස දනැ දැරියත් එ මවත් පිට කරවා තොමෝ ඒ වෙනුයෙන් දිවි දුන්නා යැ. පඬු අබා කුමරා නසන්නට ඔහු ගේ මයිලන් කිහිප වරක් මැ තැත් කළ ද සිතිර (චිත්‍ර) නම් යක් දෙටුවා එ හැම තැත් පුහු කෙළේ යැ. දැරිය 'තිම්රියංගණයට' පලාගියා, එහි යකුන් ගේ රජන වූවා යැ. ඇය අල්ලන්නට දෙ වරක් මැ **පඬුවස් දෙව්** රජ පුතුන් දරූ තැත් **සිතිර** නිසා නිපල වියැ. සිය පරපුර සතු වැ පැවැති යක් රජු ගේ වොටුන්න මකවා කුඩා කරන්නට **පඬුවස් දෙව්** පුත්තු සැරැසුණ හ. **සිතිරයා** ඒ අතරේ **පඬුවස් දෙව්රජ** මැඳුර බිඳැ සිය මුත්තණුවන් ගේ එ කිරුළ පැහැරගති.

මෙ තැන් සිටැ යැ අද කතාව.]

යක් රජු ගේ කිරුළ පැහැරගෙනැ ගිය **සිතිරයා** සෙවීමට එ ද රැ **පඬුවස්දෙව්** රජ පුතුන් නොගත් තැනෙක් නැති. එහෙත් ඒ හැම ගහට කැපූ ඉනි සේ, ගලට වැපිරූ වී සේ සිස් වියැ; නිපල වියැ. කෙළවර ඔහු තුමූ එ රැ පුරා නිදි මරමින් දිගු සැසැඳිල්ලෙකැ යෙදුණෝ යැ.

ඒ අලාබයත් අයසත් තමනට වූයේ ගබඩා නිලමේ ගේ නොසැලැකිල්ල නිසා යැ යනු කුමරුවන් වැඩි දෙනකු ගේ තීරණය වී. කෙනෙක් ඔහු ගැනැ සැක ද පහළ කළ හ.

"ඔව්, මේ මුල සිටැ මැ සිතිරයා හඳුනන්-නෙකි; ඌ අප මැඳුරේ රැඳී උන් අවදියේ සිටැ මැ දෙන්නා අතර ලොකු ඇයි-හොඳයියක් තිබුණා" යි සැකයට මුල පිරුයේ **ගිරිකඩ සිව** කුමරා යි.

සිතිරයාට දෙන දඬුවමත් ගබඩා නිලමේට මැ හෙට උදේ දියැ යුතු යැ යනු කුමරුවන් ගේ එක මැ තිරව්ව වියැ.

"මලුනි, අපේ මේ කතාවලින් ඔටුන්න මෙහි එන්නේ නැ. අප මීළඟට බැලියැ යුත්තේ එය ලබාගන්නා මඟ යි" මෙ සේ කීයේ දෙටු සෝවුරු **අබය** යි.

'අයියා ගේ ඔවා! ඔටුන්න ගෙනෙන හැටි මා දන්නවා" යි කනිටු **තිස්** තෙමේ ගිගුරුම් දිනි.

"ඔය ගිගිරුම්වලිනුත් වැඩෙක් නැ මල්ලී, ඔටුන්න එහි; අපි මෙහි. දන් මැ සෙබළ සාතාවක් තනමු"

"මට ඒ එක සෙබළකු වත් ඕනැ නැ. තනි මට පුළුවනි ඒ වැඩේ කරන්න.

"පුළුවනි, පුළුවනි, ඇයි ගිය ද රජන අල්ලන්නට ඔබත් ගියා නොවැ? ගියේ කොහොම ද? ආවේ කොහොම ද?"

"ඔන්න ඔය නිවට කතාව නවත්වන්නැ. මා මෙහි රැදෙන්නේ තව දෙ මස යි."

"ඇයි "දෙ මසෙක්?"

"මගේ කෙස්ස වැඩෙන තුරු යි මා ඉන්නේ. **සිතිරයා** මෙහි ආයේ කෙස්ස ගාගෙනැ අපේ වෙස් ගෙනැ යි. මා එහි යන්නේ කෙස්ස වඩවාගෙනැ උන් ගේ වෙස් ගෙනැ යි.

පසු දට එළි වියැ. ගබඩා නිලමේ වහා මැ කැඳවන්නට රජ අණ ලැබිණි. එහෙත් ඔහු එ ද රැ මැ අතුරුදන් වී ඇති බව දනැ රජ කුමරුවෝ පුදුම වූ හ. තමන් කළ සැසැඳිල්ලට ඔහු රහසේ කන් දුන්නා වත් දැ යි සැක කළ හ. සැකය දෙ ගුණ තෙ ගුණ වූයේ අබරණ කිළියේ වූ සියලු අබරණත් ඔහු හා මැ අතුරුදන් වී ඇති බව දැනැගත් විටැ යැ.

දෙ මසෙක් ගෙවිණි. දිනක් අඳුරේ කැලෑ ගැස්මේ ඇදෙන මිනිසෙකි. යන්නේ **'කිඹිරියංගණය'** දෙසට යැ.

මහෙහි ඔහු ගේ ඇස දුටු අමුත්තෙක් නැති. එහෙත් මහ ඔහු ගේ අමුත්ත දුටු සේ ඔහු වෙනුයෙන් මැ ඇරුණු සේ පාළුව ගෙනැ සිටියේ යැ. ඔහු කිසිවකුටත් නො පෙනී යන බව ඔහුට සිතේ. එහෙත් **සිතිර** ගේ මුර සෙබළුන් ගේ ඇස නුදුටු එක ද පියෙක් එහි නො තැබිණි. කෙසේ වුව ද හේ රජ මැඳුර අසලට මැ ආයේ යැ.

හෙල මතැ හෙළ රජ මැඳුර මඳ අඳුරේ පෙනේ. හෙල පහළ නිම්රි තැන්න යි. එහි මහ විල යි. විල අසැ බට පඳුරු ගොන්නෙකි. කල් බලා සැඟැවී සිටීමට මැ සිටැවූවා වැන්නැ. හේ තෙමේ එහි වැදී 'කාටත් නොපෙන්නට' – එහෙත් සෙබළ හී සීයකට එක ලක් වැ – සැඟැවී රජ මැඳුරට මැ ඇස් දී උන්නේ යැ.

ඔහු ගේ පිටිපසින් එහෙත් ඈතින් නො පැහැදිලි වැ ඇසෙන මිනිස් කට හඬවල් කිහිපයෙකි. කවුරුන් හෝ සැසැඳිල්ලෙකැ යෙදී ඉන්නා බවෙකි. පිටිපසට ඇස් දෙන ඔහු දුටුයේත් සිතට සැනැසුම් දෙන දක්-මෙකි.

විල බඩැ විලට මුහුණත් තමාට පසු පසත් හරවාගෙනැ සුළං ගැස්මේ පසු වන කීහිප දෙනෙකි. "උන් අතරැ ඇඳිරියෙහි ඇඳිරියක් සේ ඉන්නා මහ කයැත්තා කවරෙක් ද? යක් මහ සෙනෙවි **සිතිර** ද? එ සේ නම් රජ මැඳුරට වදින්නට කියාපු වේලාව මේ තමා!" යැ යි හෙතෙම තමාට මැ කියාගනිමින් අමුත්තක් නොදැනෙන සේ යක් ගමනින් මැඳුර අතට මැ ගියේ යැ.

"පුදුමයෙකි! "වාසල මුර සෙබළාත් සුළං ගැස්ම, ලබන්නට අර විල අසලට ගොසින් වියැ යුතු! මුට නම් පඩි වැඩි කරන්නට යි වටින්නේ! අනේ, මෙහෙමැත් රජ වාසල්! අන්න ඒකට අපේ වාසල!"

හේ දැන් රජ මිඳුලේ යැ! මිඳුලත් පාළු යි! පුදුම යි!

පිටත් වූ නැකැතට පින් දෙමින් හේ පෙරට මැ යෙයි. දැන් රජ මැඳුර තුළැ යැ. ඇතුළේ දී කිහිප දෙනෙක් මැ ඔහුට හමු වූ හ. එහෙත් ඒ හමු වූවත් එකකුදු ඔහු ගණන් ගත්තේ නැති.

"වෙස් මාරුවක් කරතොත් මගෙන් උගත යුතු" යැ යි තමා ගේ හපන් කම් ගැනැ තමා මැ පසසමින් එහෙත් මඳ වූ ද අමුත්තකට ඉඩ නො සලසමින් අමුත්තා පෙරට මැ යෙයි.

හැම කිළියෙකැ මැ හළ දෙර යැ! ඇතැ-මෙකැ අඩවල් කළ දෙර යැ! ඔහු ගේ හොර ඇස කෙළවරැ ඔහු අබරණ කිළිය වෙතට මැ ගෙනැ ගියේ යැ.

"වැසුණු දෙර ඇත්තේ ඒ තමා!" යි තමා කළ නිනච්ච සරි දැ යි බලනුව හෙතෙම එ කිළියේ දෙරට අත තැබී යැ. දෙර ඇරිණි.

"අගුළුත් නැ! ගබඩා නිලමෙත් නැ! කදිම යි ඇරැක්ම! මූ තමා හරි මැ යක්කු! අද වත් සිංහයා ගෙන් පාඩම ඉගෙනැ ගත්තේ නැති නම් ආයිත් ඉගෙනැ – ගන්නා දවසෙකුත් නැ!"

ඇරැක්මේ දුබල කමට පින් දුන් හෙතෙම පෙනෙන තෙක් මානේ කිසිවකු නුදුටුයේ 'කාටත් නොපෙනෙන්නට මැ' අබරණ කිළිය තුළට වනි.

කිළියේ මැස්සක් මතැ යක් රජු ගේ කිරුළ කුඩා පොල් තෙල් පානෙකින් තෙද පෑ සිටියේ යැ.

"අපේ මුත්තා – **විජය** – මෙ කිරුළ සිය පරපුර සතු කරන්නට යි එ ද රැ යක් රජ මැඳුරේ වූවන් එකකුත් නැරැ කඩු – ගැයේ. අද මා එ කිරුළ යළි සිංහයන් සතු කරන්නේ එක යකකුත් කඩු නො ගා යි! එහෙත් කවුරුන් හෝ යකකු මෙහි ආවොත්! උෟ හඬක් නො නගන්නට මැ බාවන්නේ

මෙන්න මෙයින් තමා!'' යි මෙ සේ තමාට මැ වහසි බිණූ කුමරා එ තෙක් ඔහු ගේ ඇඳි වත අස්සේ සඟවා - ගෙනැ තුබූ කිසි යම් අවියක් අතට ගති. පහන එ හැඳින්නේ යැ. පහනින් සිය කිරුළ හඳුනාගත්තාක් මෙන් ඒ අවිය ද සිනා පෑ සිටියේ යි. **මහ කහල්සෙන්** මහ රජු ගේ මහුල් කඩුව යි ඒ. **පඬුවස් දෙව්** රජ ගෙයි අබරණ කිළිය අත ගා-ගෙනැ පලාගිය ගබඩා නිලමේ ගේ අතට එය හසු නුවූයේ එ ද එ විටැ ඒ රජ කුමරුන් අතැ වූයෙනි. යක් රජ කිරුළ යළි ගෙනැ එම් යි වෙස් මාරු කැරගෙනැ පිටත් වූ බාලකුමරා සිය තනියට රැක්මට ගෙනැ ආයේ ඒ මේ කඩුව යි.

මැස්සට ළං වූ ඔහු කිරුළට අත තැබුවා පමණෙකි. කවුරුන් හෝ එහි එන පිය හඬෙක් ඇසිණි. කුමරා කිරුළට තැබූ අත වහා ගෙනැ දෙර දෙස බැලී යැ. අගුළු නැති දෙර වැසීමෙන් ද පලෙක් නැති.

පිය ගැටුම් හඬ වැඩි - වැඩියේ ඇසෙයි. කිහිප දෙනකුන් මැ එහි එන බවෙකි. 'සිංහයා' කිරුළ වූ මැස්ස යටට ඇදුණේ යැ. අඳුර රැකී තිබුණේ එහි යැ. සිංහයනට අඳුර හුරු නොවැ!

එහි ආවෝ කෙළින් මැ කිළියට මැ ආවෝ යැ. කුමරා මැස්ස යටැ සිටිය ද කඩුව නොහළේ මැ යැ. එහෙත් කොහි ද දිරි හටනට? ඇරුත් එකෙකැ? මේ එක් කරුණෙකි. අනෙක් කරුණ නම් එ ද රෑ, සිය මුත්තා – **විජය** – හටන් කළේ අවි නොගත්තවුන් හා යැ. මොහු ගත් අවි ඇත්තෝ යැ. විජය අතින් නැසුණෝ යක් රජවරු යැ. මොහු නිකම් මැ යක් සෙබළෝ යැ. යක් රජ පෙළට නෑ කම් කියැ හැක්කකුට සිටියා නම් සිටියේ සිකිර යි! එහෙත් හේ වොටුනු පළන් රජෙක් ද? කෙසේ වුව ද කුමරා නම් දැන් දැන් හට-නට කැඳවන බව දන්නා හෙයින් එ සේ කැඳවන තුරු මැ එළියට නො එම් යි මැස්ස යටැ මැ සැහැවී සිටියේ යැ.

එහෙත් සිදු වූයේ ඔහු නොපැතූ දැයෙකි. කිළියට ආ යක්කු ඔහු ගැනැ කිසි මැ සැලැකිල්ලක් නො දැක්වූ හ; ඔහු දුටු බවකුදු නො ඇඟැවූ හ. ඔහු තුමූ එක්තරා සැසැ-දිල්ලක් කෙරෙති. සැසැඳිල්ලට කන් දුන් කුමරා ගේ පණ මැස්ස යටැ දී මැ ගියා සේ දැනිණි.

''කිරුළ සොර කම් කැරගන්නට පැමිණි-යකු අසු වුව හොත් උහුට දෙන දඬුවම කිමෙක් ද?''

'අසූවල් දේ කරමු යි එකෙක් කී යැ'

'ඒ මදි!'

'එ සේ නම්. මේ දඬුවම දෙමු.'

'ඒත් දරුණු මදි'

'එ සේ නම මෙක!'

'ඔව් ඒක හොඳ යි.'

මැස්ස යටැ උන් කුමරාට කිරුළ තබා තමා ගේ පණත් දැන් තමාට නැති බව මැ දැනෙයි.

සෙබළු කිළියෙන් ඉවත් වූ හ. කුමරා යන්තම් හුස්ම ගත්තේ උන් ගිය විටැ යැ.

''දැන් කළ යුත්තේ කිරුළට වඩා වටිනා පණ ගෙනැ මින් පලා යැම යි.'' මෙ සේ සිතූ හේ සැහැවී උන් මැස්ස යටින් එළියට ඇදුණේ යැ. අවාසනාවෙකැ මහත! ඔහු ගේ එළියට ඇදීමත් සිතිර ගේ එහි පැමිණීමත් එක් විටැ වී.

කුමරාට නියැවුණේ යැ. සිතිර සිනා සුණේ යැ. කුමරා වෙවුලන්නට වියැ. අසිපත ද ගිලිහී ගියේ යැ.

''කඩුව ගනුව!''

කුමරා එ සේ කෙළේ යැ. දැන් දැන් වන්නට යන දෑ ඔහුට මැවී පෙනේ. එහෙත් වූයේ අනෙකෙක් මැ යැ. මොළොක් බසින් සිතිර ඔහු ඇමැතී යැ.

''ආයේ තනි වැ මැ ද?''

කුමරා පිළිතුරු දුන්නේ කටින් නො වේ; හිසිනි.

මහැ ගහටෙක් විණි ද?''

කුමරා හිස දෙ පසට සැලී යැ. ඔහු ගේ තොල කට හොඳට මැ වියැලී ගොස් තිබිණි.

''පැන් පාසු ඇවැසි ද?''

කුමරා ගොළු වියැ. ඔහුට පැන් පමණක් නො වැ රැ රජ බොජුන් ද ලැබිණි. රැ බත ගත් හෙතෙම යන රිසි හැඟැවී යැ.

''කොහි යන්නට ද?''

''ආ පසු යන්නට.

''දැන් නො යව. මහ රැ වන මහැ තනිවැ යනු නුවණට හුරු නො වේ.''

ඔහුට යහන් පහසුව ද ලැබිණි; පසු ද අරුමුසුව ද ලැබිණි.

''දැන් මම් යන්නම්''

''එ සේ යා දියැ නොහැකි යි. රජන වැඳැ අවසර ලබා යැ යා යුතු. රජ සබට තව වේලා ඇති.''

රජ සබට පමුණුවනු ලැබූ කුමරා රජන වැඳැ යැමට අවසර යැදූ සිටියේ යැ.

''මගේ මිමුත්තණුවන් ගේ – මහ කහල්-සෙන් මහ රජාණන් ගේ - තෙල මඟුල් කඩුව මෙහි බාර දෙනු!''

කුමරා යළි සිය ඇඳුමට යට කොටැ සඟවාගෙනැ සිටි අසිපත වෙවුලන දෙහොතින් ගෙනැ රජනට පිළිගැන්වී යැ. රජන එය පිළිගෙනැ ඔහු අතට ද තිළිණ විසින් පොදියක් දුන්නා යැ. හේ නැඹුරු වැ එය දෙහොතින් පිළිගති.

''දැන් යව''

කුමරා පඬුවස් නුවර බලා ගියේ යැ. ඔහු ගේ පැමිණීම සොහොවුරු රජ කුමරු-වන් ගේ මහත් සොම්නසට කරුණු වී. හෙතෙම තමා ගෙනා පොදිය විවර කොටැ සොහොවුරන් දැක්වී. එහි වූයේ එ ද ගබඩා නිලමේ විසින් සිය අබරණ කිළියෙන් පැහැරගෙනැ යනු ලැබූ අබරණ අතර වූ යක් රජුනට නො අයත් – තමන් අයත්, අබරණ පමණෙකි.

''ඔබට මේ ලැබුණේ කෙසේ ද?''

''මම කෙසේ හෝ ලබාගත්තෙමි.''

''කෝ කිරුළ?''

''එය උන් සඟවාලා! මෙය ලබා ගත්තේත් කො තරම් තැතින් ද?''

මෙහි දී දෙටු සෝවුරු අබය කුමරා පැනයක් නැඟී:

''ඇත්ත කියව! කෝ ඔබ යද්දී ගෙනැ ගිය, යක් රජුගේ මඟුල් කඩුව!''

## ගැදි තරග පල

මුල් තැන — තිරිකුණාමලේ මුත්තුරුවේ රජයේ මැදි විදුහලේ
ඇ. ලොරන්සු රණසිංහ

සමත් තැන — ගල්කිස්සේ, සාන්ත තොමොසු විදුහලේ
රොහාන් පෙරේරා

# දූහුන පබළු

කාලිංග විජයවර්ධන

## නිල දැරුම

බරක් ගෙන යන්නා ඒ බර ගෙන යෑමට තරම් සවි ඇත්තකු වන්න ඕනෑ. එ සේ නැත්නම් ඒ බරට ම යට වී ඔහු වැනැසී යන්නට පුළුවනි.

වග කිව යුතු නිලය ද ඒ වාගේ ම බරෙකි. ඒ නිසා නිලය දරන්නා ඒ බර ඉසිලීමට සමතකු විය යුතු ය.

තනතුරට නුසුදුස්සකු පත් වුණා ම ඔහුට ඒක මහ බරක් වෙනවා. ඒ බඳු තැනැත් - තාට කිසිවක් කැරගන්න බැරි වී නිකම් ම කෝලමක් වෙනවා. ඔහු යටතේ සිටින අය ඔහුට කීකරු වන්නේ නැහැ.

ඔහුට තරහ එන්නේත් ඕනෑ නැති වෙලා-වෙක යි; නැත්නම් වැරැදි තැන දී ය. එතකොට අනෙක් අයට ඒක විහිළුවක් වෙනවා.

වග කිය යුතු නිලයක් දැරීමට; තනතුරක් ඉසිලීමට උස, මහත, හයිය සුදුසු කමෙක් නො වේ. ඒකට ඕනෑ කරන්නේ නුවණේ හයිය යි. ලොවේ හැම දේ ම නුවණට යට යි.

උසස් තනතුරකට පත් වන්නා නුවණින් ගුණදහමින් උසස් තැනැත්තකු විය යුතු යි. එ විට යි ඔහු ලැබූ තනතුර බැබැළෙන්නේ.

ලොවේ තනතුර බබළවන්නෝ ඉතා ම හිඟ යි. වැඩි දෙනා තනතුරින් බැබැළෙන්-නට බලන අය යි. තනතුර නිසා බැබැ-ළෙන්නට හිතන මෝඩයන් කවර ද වත් ඔවුන් හිතන විදියට බැබැළෙන්නේ නැහැ.

තමා නිසා තනතුර බැබැළේ නම් ඒ තනතුරට පත් වූයේ සුදුස්සෙකි. ඔහුට සියල්ලන් ඉබේ ම කීකරු වෙනවා.

සිරිමත් **ආතර විජයවද්දන** අග විනිසකරු තුමා මගේ සීයා යි. ඒ තුමා මලේ මේ නොබෝ ද යි. ඒ මගේ සීයා ගැන මගේ තාත්තා නිතර ම මහත් ආඩම්බරයෙන් කතා කරනවා.

සිරිමත් **ඇලන් රෝස්** තුමා මගේ සීයා ගැන කතා කරද්දී මෙන්න මෙහෙම කියා තියෙනවා; **"තනතුර දරන්නා තනතුරට වඩා උසස් විය යුතු යි."**

ගල්කිස්සේ
සාන්ත තොමෝසු විදුහලේ
පස්වැන්නා.

# කියන සිංහලය

කුමාරතුංග මුනිදස

[මෙයට එකුන්තිස් වසරකට පෙර ලියැවුණු මෙය, ලක් මිණි පහනේ (2478 නිකිණි පුර 5) යකපු පබඳෙකි.]

පසු ගිය දිනෙකැ නිව්ටඹුවේ අභ්‍යාස විද්‍යාලයයෙහි හැඟි බෙද දීමේ උත්සවයට පැමිණි සොයිසා දර්‍ශන විද්‍යා විශාරදයෝ ඉතා වැදගත් ප්‍රශ්නයක් නැඟූ හ. එ නම් "ලියන සිංහලය මෙන් කියන සිංහලයත් ව්‍යාකරණානුකූල කළ නො හැකි ද?" යනු යි. "නො හැකි නො වේ" යනු අපට දියැ හැකි එක මැ උත්තරය යි. එහෙත් කියන භාෂාව ව්‍යාකරණානුකූල වන්නට පෙර සිදු වියැ යුතු කිහිපයෙක් වෙයි. ශික්‍ෂකයෝ අභීත වියැ යුත්තා හ. පරීක්‍ෂකයෝ දත යුත්තා හ. අධ්‍යක්‍ෂයෝ උගත යුත්තා හ. අමාත්‍යයෝ බලවත් වියැ යුත්තා හ.

යටත් පිරිසෙයින් පාඨශාලාවලැ වත් කියන භාෂාව ව්‍යාකරණානුකූල කිරීම ශික්‍ෂකයනට සතියෙකින් කළ හැකි යැ. කියන භාෂායෙහි කෙළින් කළ යුතු වැ පෙනෙනුයේ උක්තාඛ්‍යාත සම්බන්ධය පමණෙකි. එහි ලා වරදින් මිදෙන්නට සිංහලයෙහි මහඟු රීතියෙක් වෙයි එ නම් භාව සම්බන්ධය යි.

හේ යේ, ඔහු යෙති
තෝ යෙහි, තෙපි යෙහු
මම යෙමි: අපි යමු

යනාදිය උක්තාඛ්‍යාතය පිළිබඳ සවිශෙෂ සම්බන්ධය ඇති කොටැ යොදන පරිදි යි. භාව සම්බන්ධයෙන් යෙදූ කලැ.

ඔහු යනවා, ඔවුන් යනවා
තා යනවා, තොප යනවා
මා යනවා, අප යනවා

යනාදිය වෙයි. 'යනවා' යන ක්‍රියා භාවය සියලු තන්හි එක සේ සිටී. වෙනස් වන්නේ නාරකය යි. එය හේ, ඔහු, තෝ, තෙපි, මම, අපි, – යන විසින් ප්‍රථමාන්ත නො කොටැ, ඔහු, ඔවුන් – තා, තොප – මා, අප – යන විසින් ද්විතීයාන්ත කළ යුතු බව සිතට ගත් කල්හි, දුෂ්කර වියැ යුත්තේ වරදින් මිදීම නො වේ, වරද කිරීම යි.

සිංහලය මඳකුත් නො ඉගෙනැ බැළයන් ගේ බස් අසා පද දෙකක් තුනක් අවුළා – ගෙනැ, පාලකයන් ගේ නිවට කම නිසා දර්පිත වැ, "අපිත් සිංහලය දන්නම් හ" යි විළි නැති වැ ඉදිරියට එන්නවුන් අතින් කැරෙන වැරදි නම් මෙයට ඉතා වැඩි යැ. ඔවුන් ගේ අඩියත්, එඩියත්, පඩියත් එක සේ රකිමින් වැරැදි හරි ගස්සා ගන්නා ලෙසක් පෙන්වීම. දෙවියන් විසිනුදු නො කළ හැකි යැ. පාලකයන් හසර නො දත් හෙයින් මෙ බන්දෝ උසස් අඩියෙහි සිටැ මහත් පඩි ලබමින්, මහත් එඩියෙන් හරි සිංහලය කසළ ගොඩට දමා තමන් දත් බැළ සිංහලය ඉදිරියට අදිති. නිදෙස් කොඳු ඇට පෙළක් ඇති ශික්‍ෂකයෝ වෙත් නම්, කො තරම් උසස් අඩියෙකැ සිටිය ද නො දත්තවුන් නො දත් බව ඔවුන් ගේ මුහුණට කියා පෑ, නිවැරැදි සිංහලය හඳුන්වා දීම යි, ඇත්ත නො පිළිගෙනැ උදර කම් දක්වන්නට අව හොත් ඇති පදම් අඳුන්වා දී අනුනට වත් මහ හෙළි කොටැ තිබීම යි. එ සේ කළ නො හැකි නම් බැරි ශික්‍ෂක කම් කිරීමෙන් පිදුරට පවා නුසුදුසු වූ දීන බඩ රැකැ රට කැත නො කොටැ ජාතිය නො වනසා, සිංහල නාමයේ මඩ නො ගා, නම්බු පිටින් ගෙදර යැම යි.

සොයිසා විශාරදයෝ තව ද වැදගත් කරුණක් කියා පෑ හ. ඉංගිරිසි පාඨශාලා-

වලැ පහළ බාලාංශයෙහි පටන් මැ ව්‍යාකරණානුකූල භාෂායෙන් මැ කියන්නට මහත් උත්සාහයෙන් සලසති. සිංහල පාඨශාලායෙහි එ බන්දෙක් අවසාන පංක්ති-යෙහි දී ද නො කැරෙයි. කවර හෙයින් ද? මීට බලවත් හේතු ඇති. අධ්‍යක්ෂ තැන ඉංගිරිසිය හොඳින් දන්නා හෙයින්, ව්‍යාකරණානුකූල ඉංගිරිසියෙන් කීම නො-බැරි බව දන්නා හෙයින්, වරද නො ඉවසයි. ව්‍යාකරණානුකූල ඉංගිරිසියෙන් ලියන්නට කියන්නට දන්නා පරීක්ෂකයන් පත් කෙරෙයි. පරීක්ෂකයෝ ඉංගිරිසිය හොඳින් දන්නාහු ශික්ෂකයන් ගෙන් පමණක් නො වැ ශිෂ්‍ය-යන් ගෙන් ද නිවැරැදි භාෂාව පතති. ශික්ෂකයෝ ඉංගිරිසිය මැනැවින් දන්නාහු නිවැරැදි ඉංගිරිසියෙන් කියති, ශිෂ්‍යයන් නිවැරැදි ඉංගිරිසිය මැ අසති, වරද දුකැ නො ඉවසා වහා හරි ගස්සති. ඉතින් ඉංගිරිසි පාසලෙහි නිවැරැදි බස මැ ව්‍යවහාර වීමට කවර බාධා ද?

සිංහල පාඨශාලායෙහි මේ සියල්ල විපරීත වැ ලැබේ. අධ්‍යක්ෂ තැන සිංහල අකුරකුත් නො දන්නේ නො දත්තවුන් හට පරීක්ෂක කම් දෙයි. ඔවුන් ඉංගිරිසිය වරද්ද – වරද්ද දොඩන කලැ අධ්‍යක්ෂ තැන සිතනුයේ, "ඉංගිරිසි මෙ තරම් වරද්දන්නේ සිංහල-යෙහි පරතෙරට ගිය බැවින් යැ" යනු යි. නො දත් ඔහුට ඇත්ත කියා දෙන්නෙක් නැති. සිංහල නො දන්නා පරීක්ෂකයෝ වැරැදි සිංහලයට මැ අනුබල දෙති, වැරැදි සිංහලයෙන් ලියන කියන ශිෂ්‍යයන් ශිෂ්‍ය-කයන් නළවති, නිවැරැදි සිංහලයට ඕනා සෙති, එයින් ලියන ශිෂ්‍යයනට ශික්ෂකයනට රවති, ගොරවති තමන් ගේ තනතුරෙහි බලයෙන් මඩි කම් ද කරවති. බන සුලු හීන ගති ඇති, සිය බඩෙහි අල්ලන පමණ පමණක් මැනැ – ගත් ශික්ෂකාපසදයෝ, "සිය බසට දූයට රටට කුමක් වුවත් තම් කිම; අපේ සාල් පතට වරදක් නොකරම් හ" යි ඉටා–ගත්තාහු නිවැරැදි බස දූකැ ද, පරීක්ෂකයන් පහදවනු සඳහා වැරැදි බසින් මැ ලියති, කියති, ලියවති, කියවති. ජන්මය බලවත් වූයෙන්, කොඳු ඇට පෙළෙහි රෝග නුවූයෙන්, කල්‍යාණාශ්‍රයයට පැමිණියෙන් කෙසේ දෝ සිංහල සිත් ලැබූයෙන් පරීක්ෂකයන් ගේ රැවුම් ගෙරැවුම දෙ දූරැවුම් නො සලකන, ශික්ෂක බව ඒ තැනැ මැ තබා දූන් ගෙදර යන්නට වූ වද නො තරම් කමකට නො නැමෙන ශික්ෂක වීරයෝ ද ඇත්තාහු මැ යැ. ඔහු නිවැරැදි සිංහලයෙන් ලියති ලියවති, කියති, කියවති, හීනයෝ ඔවුනට ඇනැ දී සිනා සෙති, සරදම් කෙරෙති, යටි තොල දික් කෙරෙති. ළඟට පැමිණැ මුලු ගැන්නෙති, උගුරෙහි අමාරුවක් ඇති ලෙස හඟවති, කන මුත් කට යොදන්නට මැළි වෙති. ශික්ෂක වීරයෙනි. ඔවුනට දයාව මැ දක්වවු, රට ජාතිය ගැනැ මැ සිතවු, දිවි දු නො තකා එ දෙකට වැඩක් මැ සලසවු. එ දෙකට තොප ගෙන් මුත් බැහැරින් සරණෙක් නැති.

සිංහලය හොඳ හැටි දන්නා අධ්‍යක්ෂයකු පත් නො වන තාක් අධ්‍යාපන මණ්ඩලයෙන් සිය බසට වහලෙක් නො ලැබේ. අප ගේ රාජ්‍ය මන්ත්‍රීවරු කුමක් කෙරෙත් ද? අභාග්‍යයෙකි! ඔවුන් ගෙන් කී දෙනකු ගේ හදෙහි සිය බසට ආදරයෙක් වේ ද? තමන් දත ද, නො දත ද, සිංහල අකුරකුත් නො දන්නා අමාත්‍යයකු ගෙන් රටට වැඩක් නැති බව සලකා–ගැනීම මන්ත්‍රීවරුනට දුෂ්කර වියැ යුතු නො වේ. කවර හෙයින් ඔහු නැඟී සිටැ අධ්‍යක්ෂයා සිංහලය දත්තකු වියැ යුතු බව කියා උද්ඝෝෂණය නො කෙරෙත් ද? සිංහලය දන්නා අධ්‍යක්ෂයෙක් වේ නම්, දූන් අධ්‍යාපන මණ්ඩලයෙහි කැරෙන මහ බොරු දහසින් නව සිය අනූ නවයෙක් මැ අතුරුදහන් වන්නේ යැ.

දිනක් ශික්ෂකයන් ගේ මහා සභාවෙකැ දී, අධ්‍යාපනාමාත්‍ය, අධ්‍යාපනාධ්‍යක්ෂ දෙ පළ ඉදිරියෙහි දී, උගත් වැදූගත් මහ පිරිසක් අබිමුවෙහි දී, එක් මහා පරීක්ෂකයෙක් විසිතුරු දේශනාවක් කෙරෙමින් අධ්‍යාපන - අධ්‍යක්ෂ – ශිෂ්‍ය යනාදිය අලුත් සිංහලයට හරවා අදියාපන, අදියක්ෂ, ශික්ෂ යනාදිය කීයේ යැ. අධ්‍යක්ෂ තැන නො දත්තෙන් කුමක් කෙරේ ද? අමාත්‍ය තැන නොදත්තෙක් මැ නො වේ. එහෙත් කුමක් කරන්නට ද? අපට ලැබී ඇත්තේ අමාත්‍ය නම් පමණෙකි. අමාත්‍ය බලය තව මැ මහැ යැ, එමින් සිටී. කෙළින් මැ ඒ ද? හැරී යේ දූ යි බලමු.

ගැදි තරගය (දිනූ පබඳ)

# නිදහස

ඇ. ලොරන්සු රණසිංහ

මෙම ලෝ විසින් යම් කිසි රටකට හෝ දූයකට, හෝ කෙනකුට ලද හැකි උසස්මැ දයාදය නම් නිදහස යැ. මිනිසා දෙව් බව කරා එසැවෙන්නේ ද නිදහසෙහි ඇති අරුම පුදුම බලය නිසා යැ. නිදහසින් තොර වූ දිවියක් ගත කරන මිනිසා 'මිනිස්' යන නම ලැබීමට පවා නුසුදුස්සෙකි. මිනිස් යන්නෙහි අරුත, මන් + උස් හෙවත් මනසින් උසස් වූයේ යනු මැ නොවැ? ඔව්, ඒ උසස් බව නමැති අමා මිහිර මිනිසා කරා ළඟා කැරෙනුයේ නිදහස නමැති සුරබි දෙන විසිනි. මිනිසා ගේ හැම හැකියාවකට මැ තෝ තැන්නෙකි නිදහස. එ හෙයිනි එය අන් හැම කරුණකට මැ වඩා වෙසෙසී, කැපී, උසින් නැඟී සිටින්නේ.

නිදහස නොලත් මිනිසාත්, කැලෑවේ වෙසෙන තිරිසන් සතාත් අතර ඇත්තේ මඳ වෙනෙසෙකි. නිදහසේ හැසිරෙන තිරිසනා වුව ද, නිදහස නොලත් මිනිසාට වඩා අගය කට යුතු වන්නේ යැ. කුමක් සඳහා අපි මෙ ලොව ජීවත් වෙමු දැ යි, අපන් මැ විමසමු. එයට පිළිතුර ද අපි මැ සපයමු. අපි අපේ වගට, පොදු විසින් සැලැකෙන කල්හි මිනිස් වගට යම් මෙහෙයක් ඉටුකරන්නට මෙලොවැ ජීවත් වමු. අපෙන් ඉටු වියැ යුතු මෙහෙය කෙබන්දෙක් දැ යි මඳක් සොයා බලමු. ලොවට පහළ වූ නිසා ගෙවන දිවියෙහිත්, මිනිස් වගට යම් මෙහෙයක් සිදු කෙරෙමි යි අරමුණු කැර ගෙවන දිවියෙහිත් ඇත්තේ ලොකු වෙනයෙකි. උපන්නාට දිවි ගෙවන්නේ නිකමෙකි. උගෙන් උගේ දූයට නිබා ඌට වත් වැඩෙක් නම් සිදු නොවේ. සිදු වෙතොත් හානියෙක් මැ යි. මිනිස් වගට මහ මෙහෙයක් කෙරෙමියි ඉටුවහු ගේ පරමරුත ද උසස් යැ. පැතුම් ද උසස් යැ. එ හෙයින් ඉටු වන කම ද උසස් වියැ යුත්තේ යැ.

තෙමේ තමා මැ ඉසුරුමත් නොවූයේ නම් අනුන් ගේ දූකට පිහිට වන්නට නොසමත් යැ. පහනෙකින් එළිය දෙන්නට නම් පහනෙහි තෙල් තිබියැ යුතු යැ. පැළයක් පැළ වී සරු පල බෙදන්නට නම් එ හැප්–සෙන බිම සරු වියැ යුතු යැ. මේ හැමෙකකටම පොදු දහමෙකි. අප අනුනට යම් මෙහෙයක් කරන්නට නම් අප කෙරෙහි එ මෙහෙයට සෑහෙන තරම පොහොසත් බවක් තිබියැ යුතු යැ. මේ පොහොසත් කම මැනෙනුයේ මිල මුදලිනුදු නො වේ. රන් රිදීයෙනුදු නො වේ. ඒ හැමටම වඩා උසස්තම නිදහසෙනි. සිතිවිලිවලින් උසස් වූ තැනැත්තේ උසස් මෙහෙයකට සුදුස්සේ යැ. නිදහස් සිත සද සුව පත් යැ. එ හෙයින් නිදහස් සිතෙහි පහළ වන අදහස් ද ලොවට වැඩ දයක බව කිව යුතු නො වේ. කවර අතින් හෝ වූ දස බව, වහල් බව, මිනිස් නමට නිහාවෙකි. සිතිවිලිවලින් දස වූ තැනැත්තේ පරම දීනයෙකි. දීන සිතෙකැ උදර අදහස් කෙසේ නම් ඇති වේ ද?

නිදහස පිළිබඳ වැ අප කතා කිරිමෙ දී පළමු වැ සැලැකියැ යුත්තේ එකිනෙක මිනිසා ගේ නිදහස ගැනැ යි. හැයි? මිනිසුන් රැසෙකිනි සමාජයක් තැනෙන්නේ. එක එක මිනිසා නිදහස් නම් ඔවුන් ගෙන් සැදුණු පවුල ද නිදහස් යැ. එක එක පවුල නිදහස් නම් එ පවුල් රැසින් බැඳුණු ගමත්, ගම රැසින් වෙළුණු රටත්, දූයත්, නිදහස් යැ යි ඉඳුරා මැ කිව හැකි යි. නිදහස් හිතක් ඇත්තහු ගේ හිත වැදගත් අදහස්වලින් සැදුණේ වෙයි. තමට

හැරෙනුයේ මේ වැදගත් මැ අදහස් නොවේ ද? එ සේ නම්, එ බඳුවුන් ගෙන් තොර නොවුණු සමාජයක් ඉදිරිය කරා වේගයෙන් ගමන් කරන බව ඇත්තෙකි. සිය රට පිළිබඳ වැ ඇල්මක් ඇති වන්නේ, සිය දූය පිළිබඳ වැ ඇල්මක් ඇති වන්නේ නිදහස් හිස් ඇති ජනයා අතරේ යි. දෑ – ඇල්ම ඇතියවුන් අතර සියත් බව නිතැතින් මැ රැකේ. අලුත් අලුත් අදහස්වලින් නවතම නිපැයුම් බිහි වන්නේ නිදහස ඉදිරියවුව සඳහා මිනිස් මනස ඔසොවන හෙයිනි.

නිදහසෙහි අගය අප කො තරම් ඉහළින් ඇගැයුව ද, නිදහස නොරිසියෙන්නවුන් අතර, ඉන් වැඩක් කැල මැ නොසිදු වන්නේ යැ. නිදහස ඉදිරියෙහි අඳ වැ, ගොළු වැ, බිහිරි වැ, දීන වැ සිටින ජාතියෙකැ කවර කවර තරමෙ පහත් කම් දක්නට ලැබේ ද? මෙයට පිළිතුරු පතා වැඩි ඈතට ඇදෙන්නට ඇවැසියාවෙක් නැති. බලන්නැ අපේ රටේ මැ, මෙ හෙළ පොළොවේ මැ වෙසෙන "සී හෙළයන්" දෙස. ඔහු නම් ලොවැ කවර රටෙකැ වත් දක්නට නොලැබෙන පිරිසෙකි! උනට දූයෙක විත්තියක් වුවමනා නැති. තමන් සොරකු ගෙන් නොවැ බූරුවකු ගෙන් පැවැතිණැ යි කියුව ද ඔවුනට, ඒ එ තරම් සැලැකියැ යුත්තෙක් නො වෙයි. සිය බස නහාලියැ යුතු යැ යන අදහසට ඔවුහු කිසි සේත් එකඟ නො වෙති. සිය රටේ සිටින පඬුවකු ගේ අදහසට වඩා අන් රටෙකැ වෙසෙන බැළයකු ගේ බස සීහෙළයෝ මුඳුනත් දී, සාදුකාර දී පිළිගනිති. එ හෙයින් මැ දූය, දිනැ දිනැ දීන පසට මැ යැවුණේ යැ. අන් දෙස් හි ලේ වගුරුවා, දිවි පුද කොටැ ලබන නිදහස, මුනට තැගි සමහ පුද කළ ද නො පිළිගනිති, තතු මෙ සේ නොපිටට යැවුණේ කවර කරුණක් නිසා ද?

එබෙමු අපේ යට ගියාව දෙසට. එ ද තතු මෙ ද තතු සසඳත, කවර නම් හෙළ හදවතක් නො රිදවා ද? ලොවැ මුල් මහ හැදියාවකම උරුම වූ, මෙ අනැඟි හෙළ රැස පෙර නිදහස් දූයෙක් වූ හ. ඔවුහු එයින් මැ බැබැළුණු හ. අන් රටවලට ද සිය නැණ එළිය, හැකියා සමත් කම් බෙදූ හ. එ හෙයින් මැ අප රට අසම මිනිසුන් ගෙන් පිරුණු දිවයිනෙක් වියැ. "තුන් ලෝ නමා නතු කළ රවුළු" යන කියමන මැ එයට දෙස් දෙනු ඇති. ඉදින් මෙ බඳු පරම පිවිතුරු දූයෙකැ නැස්පත්තියෙ උපන ඇති වූයේ කවර ද සිටැ ද? විදෙසින් ගේ බලපැමට යටත් වූ ද සිටැ යැ, විදෙසින් ගේ මුහුණුවර අප තුළට කාවැදුණු ද සිටැ යැ. එයින් බසේ ඔද බිඳෙන්නට වී යැ; රැසේ පණ සිඳෙන්නට වී යැ; දෙසේ බල බසින්නට වී යැ. අනුන් ගේ දෙයෙහි නැති අගයත්, වහල් බවෙහි සුවයත්, ගැති බවෙහි මිහිරත් අප රටට ඇබ්බැහි වූයේ ඔය නියායෙනි.

මේ දරුණු රොවට පිළියම් කිරීමට සුදුසු අවදිය දැන් එළැඹැ සිටී. අප විසින් යෙදියැ යුතු පළමු පිළියම නම් මිනිස් නිදහසෙහි අගය උනට වහා වටහාදීම යි. එය මැ දූයේ නිදහසට ඇති එක මැ මග යි. මැකීගිය අපේ අතීතය යළි අප ඉදිරියට පැමිණැවියැ යුතු යි. ඉන් ලැබෙන එඩියෙන් නිඳන්නවුන්ගේ මැළි කම් හැම දුරු කළ හැකි යැ. සිය දූයෙහි අගය පෙනෙන කලැ ද නොපුබුදු වන්නෝ මෙ ලොවට නොනිස්සෝ යැ.

නිදහසින් නොනිසි වර පතන්නෝ ද වෙති. ඔවුහු නිදහස දඩමීමා කොටැ, නායක බවට ගිජු වීමෙන් හෝ, තැනැති අදහස් මුඳුන් පත් කැරගැනීමට උසහ ගනිති. එය දූයට අහිතකර යැ. නිදහස යෙදැවිය යුත්තේ දියුණුවට නැඟීමට විනා පිරිහුමට වැටීමට නො වේ. දියුණුව කරා යන නිදහස නියම නිදහස යි. අමර බව ඇත්තේ එ තනැ යි.

# දළ සල කුමරු ගෙ සැරය

[පළ කැරුම - උණවටුනේ හේළි පහරුව.
මිල රු: 2.50 යි.

දනට සිංහලයෙහි ලැබෙන ආදි මැ අසුත් කව මේ වෙයි, ලියැවුණේ පළමු වැනි අක්බෝ රජ් දවසැ විසූ දෙළොස් මහ කිවියන් අතරැ වූ දළ සල කුමරුන් විසින් බව කව මැ පවසයි.[1] සැරයක් (ටීයක්) දූත කිරියෙහි යොද අනුරාපුරයේ සිටැ කතරගමැ දෙවොලට යැවෙත අයුරින් කැරිණි. අබා ගිරි වෙහෙරැ මහනම් නම් දුසිල් පැවිද්දකු දෙසට ලක් කොටැ, තෙර වාද බුදු දහම රැකැගැනුම අස්නේ අදහස යි.
කව පැදි 62 කින් යුතු යැ. සැකෙව් අරුතත් ඉංගිරිසිපෙරැළියත් සමඟ එළියෙහි දිගට පළ වෙයි. මෙ කව.]

1. පටන

1. දූරැ කසාම්බර් මුණ්ඩ
    කා ලෙවන'තරෙ සැහැසී
සුනුම් හ යි ඇප් යෙත්
    සත් ලා කෙනෙක් වරදස්

**අරුත** - කෙනෙක් කසා අම්බර් (කහ රෙදි) [ද] මුණ්ඩ (මුඩු) කා (හිස්) [ද] දූරැ (දරා) ලෙවන් අතරෙ වරදස (වැරැදි) සත් ලා (සඟවා) 'ඇප් සැසී සුනුම් හ' යි (බුදු පුතුම් හ' යි) යෙත් (කියති).

**පෙරැළිය** — Garbed in saffron robes and with shaven heads, yet concealing their faults from the eyes of the world, some say, "We are the sons of the Buddha!"

2. සැදූහැ සපත් බික
    පිරිහුණු හුදෙකලා වූ
මහ ලැ ලැ කමුද්
    පර් බතට' ළ වැනි වියත් කම්

**අරුත** - සැදූහැ සපත් (යුතු) බික (බිකුවෝ - 'භික්ෂුහු') පිරිහුණු; හුදෙකලා වූ [හ]; මහ වියත් කම් ලැ (ලූ) ලැ කමුද් (ලිවීමෙ කට යුත්තත්) පර් (පර) බතට අළ (මෙහෙයූ) වැනි [මහ පඬි කම් හඟවා ලියූ පතපොතත් දත් බත් සඳහා ලු!] ·

**පෙරැළිය** — The state of the zealous Bhikkus declined; They became isolated, The written word full of great learning, seemed to be directed – only to the gaining of others alms!

3. ලෙවනට සෙත් සද
    සද - ලන දම් මුනින්ද
නින්ද ගතැහි මෙ ද
    මෙ ද නො රන්දයි සඟ මුවැ

**අරුත** - සද (සියලු කල්හි) ලෙවනට (ලෙවනට - ලෝ වැස්සනට) සෙත් සද - ලන මුනින්ද (මුනිඳා ගෙ) දම් (දහම), මෙ ද (මෙ දවසැ) ගතැහි (පොතෙහි) නින්ද (නිඳා; නිඳාගනී); මෙ ද (මෙ දහම් දව [බුදු දහම සලකා කියැවිණි] සඟ (සඟුන් ගෙ) මුවැ (මුවෙහි) නො රන්දය් (නො රඳයි.)

**පෙරැළිය** — The word of the Buddha, which brings blessings at all times, to day reposes in the (sacred) book, It is not found on the lips of the Sanga.

4. මුන් පිහි ලූ විලස්
    පා එළිහි අන්දරෝරැහි
නිති ගර වත් සුව වින්දුන
    දක්තු දුක් දය් එ හෙනෙනි -

**අරුත** - එළිහි (එළියේ - එළි පිටැ) පිහි (විවේ [විවේක සුව) ලූ (ගත්) විලස්(සැටි) පෑ (පෙන්වා) අන්දරෝරැහි (අඳුරු මුවායෙහි ['අන්ධකාරෝදරයෙහි'] නිති ගර වත් (ගිහි පැවැතුම්) සුව වින්දුන (විඳින) මුන් (මොවුන්) දක්තු (දක්නා කලැ) දුක් දයි (දුක් ද - 'දුඃඛ දයක' යැ). එ හෙනෙනි (එ හෙයින්) [12 පැදියෙහි 'සැරය'යනු හා බැඳේ.]

**පෙරැළිය** — In the open, these Bhikkus seem to be detached from the world, but in the darkness, they enjoy the pleasures of a house - holders life, - To behold them gives great sorrow!

(ලබන කලබ හා බැඳෙයි.)

* * * * *

1. දළ තෙද්නි වත් හිර් - ළ-විමත් කුලුණ් මැණෙන'ලු සල සෙ නොද් සල ගත් - ලක්හි එක් සෙ සත් ලැඟු; කෙළෙ නිරින්දු අග්බෝය් - ළෙහි ලෙව් ලැ ස-වස්නිති මෙ ද දම් රක්න වස් - දළ සල කුමර් ලැනා (61, 62 පැදි)

# දරුවනට දඩුවම

අරීසෙන් අහුබුදු

දූව, දූන් වත් ඇඟ සෝදවා ගන්නැ අම්මාට කියා – ලා.''

සවසැ මිදුලේ වැලි බත් උයා ඉවර වී ගෙට ගොඩ වූ සිහිති දූව බලා මම එ සේ කීමි.

''බැහැ, මාමා හෝදන්න'' දූව මෙ සේ කියේ පිලේ මා හා පිළිසඳරේ යෙදී උන් මාමා ගේ මූණට යටි ඇස් ලමිනි.

''නැහැ, දූව හෝදන්නේ මාමා නො වෙයි, අම්මයි. ඒ නිසා අම්මාට කියා හෝදවා-ගන්නැ.''

ඒ වරැ ඕ බිමැ පෙරළෙමින් හඬන්නට වූවා යැ.

''හොඳයි, ඔබ දෙ පළ මැ ගියොත් මම දූව හෝදන්නම්.'' ඇගේ අම්මා මෙ සේ කී විටැ ''හොඳයි, එහෙනම් ඔන්න මා ගියා'' යි නැඟී – ගත් මම මගේ කිළිය තුළට ගියෙමි. එ ද මා සිටියේ අඩ ගිලනෙහි යැ. එ හෙයින් කෙළින් මැ ඇඳට ගියෙමි.

දූරිය ගෙ - පිලේ වැතිරී හඬයි; මාමා ඉල්ලමින් හඬයි.

''අද නම් මාමා ලැබෙන්නේ නෑ. එහෙනම් බලමු!'' ඇඳෙහි මැ හිඳැ ගොහන්නට වීමි මම. මගේ දිව පඩා පැටැලෙන්නා සේ දැනිණි.

''මේ වැඩේ හරි යන පාටක් පේන්නේ නැහැ. කෝටුවකුත් ගෙනැ මෙන්න මෙහාට එන්න.'' මගේ බිරිය ගේ මේ අණට මම නැමුණෙමි. මාමා පෙනෙන තෙක් මානයෙකැ නො වී.

කෙවිට අමෝරා ''වරම'' ගත්තෙමි මම. එහෙත් කෙවිටෙන් වැඩ නොගත්තෙමි. මින් වූයේ ද දහදිය දමන තෙක් දෙන්නා මැ වෙහෙස වීම පමණ යි.

ඉක්බිති මගේ අණින් එහි ආ කුස්සි අම්මා දූව බලයෙන් ඔසවා – ගෙනැ ළිඳ වෙත ගෙනැ – ගියා යැ. මා බිරිය ද එහි ගියා යැ

අප ගෙදරැ මෙහෙකරු ළමයා සැන්දෑවේ 'කෝපි එක' මා අත පත් කළේ ද මෙ විටැ යැ. එය මා අතෙහි කට කට ගා වෙවුලූ සැටියෙන් මට වැටැහුණේ ඒ වේලායෙහි මා පියෙවි ගතියෙන් කො තෙක් ඈත් වී සිටියා ද යන්න යි.

හෝද කිළියට ගෙනැ එනු ලැබූ යැ දූව. එ විටැ ද ඇය හැඬුයේ මෙ සේ කියමිනි.

'මාමා හෝදන්න, මාමා හෝදන්න.''

දූව අඳවා – පළඳවා සරසත් මැ මාමා ගේ හඬ සාලයේ ඇසිණි. දූන් ඇගේ යුගත මාමා ගේ ගෙලෙහි යැ.

''මාමා හෝදන්න, මාමා හෝදන්න, ''දූවට රෑ කෑම හරි. කැවිවොත් හොඳ යි.'' ඇගේ අම්මා මෙ සේ කී විටැ මාමා ඇගේ අවුල් කෙස් අතින් සකසමින් මැ අහර කිළිය වෙත යැමට නැඟී සිටියේ යැ.

එහෙත් ඒ නිරවුල් කළ කෙස්ස ඈ යළි අවුල් කැරැ – ගන්නවා මම දිටිමි.

''ඒ ඇයි බබා?'' මාමා මෙ සේ ඇසූ විටැ ඇය කීයේ මෙය යි.

''තාත්තාට පේන්න.''

මම ඇය කෑම කන තැනට නොගියෙමි. එහෙත් ගිය ලගියේ මැ මාමා ඇය කරැ පින්නා – ගෙනැ එනු දිටිමි. ඇයි දූයි ඇසීමි.

''බත් දෙ කට යි ගිල්ලේ. අනෙක කටේ තියෙද්දී මැ නින්ද ගියා.''

මාමා ඇය ඇගේ ඇඳේ නිදි කැරැවූවා යැ. රෑ හීනෙන් කීප විටක් මැ ඇය දෙඩවනවා ඇසුණත් මට ඒ හරි හැටි නොතේරුණේ යැ. මම එය තේරුම් ගන්නට වෑයම් කෙළෙමි.

"මාමා හෝදන්න, මාමා හෝදන්න".

ඇය තුරුලු කැර - ගන්නා සේ මම ඇගේ අම්මාට කීමි. එහෙත් එ ද මවු තුරුලුව සපල වූයේ ටික වේලාවකට පමණ යි. ඕ පිබිදුණා යැ.

"මාමේ! මාමේ!!"

නළවාගනු බැරි මැ තැනැ දුව මාමා වෙතැ යවනු ලැබූ. ඕ ඔහු ගේ ඇකයට පැනැ එහි ඇලුණා යැ. මාමා ඇය හා සෙමෙන් දෙඩනු අඩවල් කැරුණු දෙරින් දුටු මම දොර ළඟැ හොරා මැ රැඳී - ගත්තෙමි.

'බබා ඒ කාමරෙන් ආවෙ ඇයි?" ඕ ඉකිගසමින් පිළිතුරු දුන්නා යැ.

"මම ආස - ම නැ - හැ, ඒ කාම - රේ - ට න - වත් යන් - නෙ - ම නැ - හැ."

"ඒ ඇයි?"

ඕ පිළිතුරු නුදුන්නා යැ.

"අම්මා එක්ක තරහ ද?" හිස දෙ පසට වනමින් 'නැ' යන්න හැඟවූවා යැ ඕ.

'එහෙනම්?'

"තාත් - තා ඉන් - න - වා" ඉකි ගසමින් මෙ සේ කී ඕ තදින් හුස්මක් ලනවා ද මා බලා - ගෙනැයි.

මාමා යළි විමැසී යැ.

"බබා තාත්තා එක්ක තරහ ද?"

ඕ හිස ළය දෙසට නමමින් ගොළුබසින් ඔව් කීවා යැ. දිග හුස්මක් ද හෙළුවා යැ.

"ඇයි, තාත්තත් එක්ක තරහ?"

"තාත්තා හරි නපුරුයි; ඊ ඊ ගැවා."

පොඩි දුව මාමා ගේ ඇකයෙහි හිඳ මා හැන්දෑවේ කළ පෙළපාළිය වෙළපනවා දුටු මට ඇති වුණේ හරි මැ හරි විළියෙකි; දළ දුකෙකි.

"කුඩා මැ දරුවනට දඬුවම් දෙන විටැත් පියෙව් ගතියෙන් පිට පනින්නට එපා" යනු ඇගේ මාමා - මා මිතුරා - මට දුන් ඔවදන යි. ඉන් අප දෙන්නා අතරේ මෙ වන් දෙ බසකට මඟ පැදිණි."

මම කීමි. "ඔබේ කතාව හරි. මට ඒක වැටහුණා ඊයේ. ඒ එක්ක මැ තව එකක් වැටැහුණා. එ නම් කාට වුණත් දඬුවමක් දෙන විටැ ඒ දෙන තැනැත්තා පියෙව් ගතියේ මැ සිටියැ යුතු බව යි."

"ඔව්, නැත්නම් ඒක දඬුවමක් වන්නේ නෑ. පමණ ඉක්මවා යැම නිසා ඇතැම් විටැ පළි ගැනීමක් වැන්නක් වෙනවා. එ විටැ එ තැනැ යුක්තියෙක් නැහැ. දඬුවම වියැ යුත්තේ යුක්තිය අනුවැ යි. දඬුවම් දෙන්නා පියෙව් ගතිය පියූ තැනැ යුක්තියට කවර ඉඩෙක් ද? යුක්තිය පිහිටන්නේ පියෙව් සිහිය - ඉතුත් වෙසෙසි පියෙව් සිහිය - උඩැ යැ.

"හොඳයි, මෙ බඳු අකීකරු කමකට දඬුවමක් දියැ යුතු නෝ ද?"

"ඒ අකීකරු කමකට යි. එහෙත් ඊයේ ඔය වුණු වැඩේ නම් අකීකරු කමක් හැටියට අප සැලැකුවාට ඇගේ ඇසින් බලන විටැ නම් එ තැනැ අකීකරු කමෙක් නෑ!"

"එහෙම ද?"

"ඔව්, එහෙම යි. තාත්තා ඇඟ හේදුවෙත් නෑ. අම්මා හේදුවෙත් නෑ. මාමා හේදුවෙත් නෑ. ඇයි ඉතින් මා විතරක් හෝදන්නෙ? මේ විදියට ඇ හිතුවා නම් එ තැනැ අකීකරු කමක් තියෙනවා ද?"

"නැහැ, ඒ වුණත් අපේ ඇහේ කුණු ගෑවිලා තිබුණේ නෑ. ඇගේ ගෑවිලා තිබුණා නේ? අප ඇය හෝදන්නට වැයම් කෙළේ ඒ නිසා නේ?"

"ඇගේ ඇහින් බලන විටැ ඇයි කුණු තිබුණා මැ! කුණු නිසා ලෙඩ හැදෙන බව දන්නෝ ඔබ අපි. ඇ දන්නේ නෑ. මෙයට

පෙර කී දවසක් ඈ කුණු තිබෙද්දී ඒ නො සෝදගෙනැ මැ උන්නා ද? ඒ ඉඳීමෙන් කිසිවක් නුණු බව යි ඈ දන්නේ? ඒ වාගේ මැ ඒ කුණු ගෑවුණු හැම විටැ මැ අප ඒ හෝදන්නෙත් නැ නොවැ? ඉතින් ඇයි අද විතරක්?'' ඇතැම් විටැ ඇය එ සේ සිතුවොත්!''

''හොඳ යි, ඔය පිරිසිදු කැරැවීම හොඳින් හෝ නොහොඳින් හෝ නො කැරැ මැ බැරි වේලාවක් - ඒ කියන්නෙ හදිසි ගමනක් බිමනක් යෙදුණු වේලාවක් – වුණොත් කෙ සේ ද එය කරන්නේ?''

''නැළැවීමෙන් - රැවැටීමෙන්! ඇයි මතක නැද්ද අපට කුඩා කලැ කසාය බෙහෙත් පෙවූ හැටි! තාත්තා හෝ වෙන යම් කිසි වැඩිහිටියකු බලයෙන් ඒ වැඩේ කරන්නට, ඇතැම් විටැ කටේ බූහනසු පවා ගහන්නට සැරැසෙනවා. එ විටැ අම්මා ඉදිරිපත් වී අපේ පැත්තට කතා කරනවා.''

''හා! හා! ඕවා ඕනැ නැ. මේක ගහලා ළමයා ගේ කට කඩන්න ද? කවුරුන් වත් මෙහාට එන්නට එපා. මගේ හොඳ පුතා ඒ අයට උජාරුවටත් එක්ක බොන්නැ.''

රැවැටුණු දරුවා එය බොනවා.

''හරි, මට තේරුණා. අර මා කෝටුව ගෙනා වේලේ මවට තිබුණේ මගෙන් එය උදුරා – ගෙනැ ඇය රැකැ – ගන්නා ලීලායෙන් නැළැවීම යි. මට තිබුණේ පැරැදී පසු බැසීම යි.''

''ඔව් එ සේ කළා නම් බිළිඳිය පියා පැරැද්දීමට මවට හවුල් වනු සඳහා සිය කැමැත්තෙන් මැ ඇඟ හෝදවා - ගන්නටත් ඉඩ තිබුණා.''

''මා කුඩා කාලේ කෙළේත් එහෙම යි. සීයාත් තාත්තාත් මට හරියට ගහනවා. ආත්තම්මා තමයි මා හැම විටැ මැ බේරා-ගන්නේ. වරක් සීයා මට ගහන්නට ගෙනා කෝටුව ආත්තම්මා උදුරන්නට ගොස් ඉන් පහරකුත් කා එය කැබැලි කැබැලි කළ හැටි මට මතක යි. ඇගේ හිත තැළීමට බැරි නිසා එ බඳු විටැ ඇය කී ඕනැ මැ නිරස දෑයක් වුවත් මා කළා.''

''සමහර වැරැදි තියෙනවා දඬුවම් දියැ යුතු. හැබැයි ඒ දඬුවම ලැබීමට තමා සුදුසු බව බිළිඳාට මැ තේරුම් යන පිළිවෙළේ වැරැදි යි ඒ.''

''නිදසුනක් කීවොත්?''

''ඔහු ඕනැ කමින් මැ කෝප්පයක් පොළො-වේ ගසා බින්ද යැ සිතමු. ඒ කෝප්පය බිඳුණු බව ඔහු දුටුවා, දන්නවා, ඒ කෙළේ වරදක් බවත් ඔහුට වැටැහෙනවා. ඒ නිසයි එ බඳු වරදකට දඬුවමක් දුන්නත් ටික වේලාවක් හඬා ඔහු මැ නවත්තන්නෙ. කොහොම වුණත් දරුවනට දඬුවම් දියැ යුත්තේ කළ වරද ඒත්තු ගැන්වීමෙන් පසු වැ යි. ඇතැම් දරුවන් වැඩුණු පසුත් මාපියනට සලකමිනුත් ඔවුන් ගේ දූකෙහි හදින් උණු වී හවුල් නොවන්නේ ඒ දරුවන් කුඩා මැ කලැ යටි මනසේ තවන් කළ මෙ බඳු අනිටු දඬුවම්හි පල නිසා බව ඒ දඬුවම් දුන්, ලැබූ දෙපස මැ නො දනිති.

(රසවාහිනී සකසුවන් ගේ අවසරයෙනි.)

# මල් පැණිය

ඩ. කුමාරසිංහ

(ගීය කලබ හා බැඳෙයි.)

මල් පැණිය, තා ගේ සැටිය මට තව ම නො වැටැහේ. තෝ ඇතැමුන් ලවා සිනහ උපදවන නොයෙක් දෑ කරවහි. හැයි, තා විහිළුවට කැමැති! හා හා! සිහි වෙයි. විහිළුවෙක් නැති නම්, සතුටෙක් නැති නම්, කවර මිහිරෙක් ද ලොවෙහි? තෝ ලොවෙහි මිහිරි බව වඩන්නට සිටින්නෙකි. එ පමණෙක් ද නො වේ. මිනිස් සිතට දිරි දෙන්නට ද සමතෙකි. කියම් ඇසූ දුටු කරුණක් දෙකක් තට ඇති මගේ මහත් සැලැකිල්ල හඟවන්නට. කමන්න වරදක් ඇතොත්.

ඉළවු ගෙයෙකි. මළේ ගෙයි වන කිසිවක් ගැන නො සලකා. තමන් ගේ අවසන් ගමන යන්නට සැදී, සිත ගල් කැර - ගෙන හොවියි. නෑ-දැයෝ බිම හැපෙති, කඳුළු වගුරුවති, දුක් මුසු හඬ නඟති. නොනෑයෝ හදෙහි පිරෙන දුක ඔබා ගෙන සිටිති. එයි එ තැනට මළවුන් ගේ දෙමළ යහළු-වෙක්, මල් පැණියෙන් හොඳට ම දිරි ලබා යන්තම් කෙළින් වී. ඔහු ගේ දෙ නෙත් රතු ය, බර ය. දෙ දිනක් කඳුළු හෙළූ නෙත් බඳු ය. හිඳිනා ගබෙහි සිටින දහ පහළොස් දෙනකුට, කලින් හැඳිනීම ඇතත් නැතත්, "අයෙම් මීස්ටෙර් තෙන්දෙයිය." කියා අතට අත දී තමා හඳුන්වා දී, මළවුන් හොවිනා ගබට ඇදී, වලපින්නට පටන්-ගනී. නෑදැයන් ගේ වැලැපීම කවර වැලැ-පීමෙක් ද! උන් ගේ දුක කවර දුකෙක් ද! ඇත්තෙන් ම මොහු ගේ වැලැපීමෙහි යම් කිසි රසයෙක් වෙයි. මළවුන් ගේ ළඟ ම නෑයන් ගේ සිතට ද දුක අමතක වන ලෙසෙක් පෙනෙයි මොහු ගේ වැලැපුම් රස එයට වැදීමෙන්. මොහු පූ මල් පැණිය මොහු ගේ වැලැපුමට රස නංවයි. මල් පැණියට කළ හැකි දෑ!

දවසක් මිනිසෙක්, මල් පැණියෙන් තරමට බඩ පුරවා ගෙන, තමා එන තෙක් ගෙදර ළ-තැවෙන ගෙදර - ඇත්තන් ගැන සලකා මඟ තිබෙන මස් කඩයකට වැද එහි ඉතිරි ව තිබෙන කිරි බඩ වැල් ගොඩක් හබරල කොළයෙක දවටවා ගෙන ගෙදර එයි. ඔහු ගේ ගමන තමා ගමන! කෙළින් යන්නට පුහුණු වන්නට නම් පවු මහෙක කුමට යේ ද! අනේ මඟ අසල ගසට කොළට, ගලට මුලට ඔහු දුන් රැවුම බැලුම් ගැසුම් දෙසුම්! ගසින් කොළින් ගලින් මුලින් ඇති කරදර ඉවර වූ හ යි සිත සනසා ගෙන ගේ ගෙ වදී. ගෙදර - ඇත්තෝ නිසි හරසර දක්වා ඔහු පිළිගනිති.

"කවරක් ද පොදියේ?

"සිරිය, ඔබට ගෙන ආවා මාලයක්.

"යස මිනිහා එ බඳු දෙයක් ගෙන එන්නට".

"ඇත්තෙන් ම ගෙන ආවා. ඉතින් ඔබට මාලයක් මාත් ගෙන එන්නේ නැති නම් කවුරුන් ද ගෙන එන්නේ! මෙන්න බලන්න.

ඡේ පොදිය ගෙන බැඳුම් මුද වැසුම හරී, ගෙදර - ඇත්තන් ගේ නෙත හැකිළෙයි, වත විළිස්සෙයි. 'චී' යන හඬ නැඟී දිගට ඇදී යෙයි.

"චී කියනවා! මෙය පැළැඳ - ගෙන මට පෙනෙන්නට එන්න ඕනෑ දැන්.

"අනේ, පිස්සු නැති ව ඉන්න.

"පිස්සු නැති ව! හොඳ හිතින් පැළැඳ ගන්නවා.

"චී. මේ හරක් බඩ වැල්.

"හරක් බඩ වැල් වුවත් මා එයට කියනවා මාලයක් ය කියා. ඒ නිසා මේ මාලය පැළැඳ - ගන්නට ම ඕනෑ.

''අනේ, මට වද නො දී ඉන්න.

''වද නො දී! මට කියා පළඳවා - ගන්න ද ඉන්නේ! ඔව්, මිනිසකු මාලයක් ගෙන ආවා ම, එය ඔහු අතින් ම පළඳවා - ගැනීමට ගැහැනිය කැමැති වෙනවා. හොඳ යි, මෙ තැන ඉඳගන්න.

ගෙදර – ඇත්තෝ බියෙන් වෙවුල-වෙවුලා, කොච්චර පිපිරි - පිපිරි කවරක් කරන්නට දැ යි නො දැන සිටිති.

''මෙ තැ – න ඉ – ඳ ගන්–න–ට කී–වා.

හේ යළි දු අණ දෙයි, පිරිසිදු තද හඬ නඟා. ගෙදර–ඇත්තෝ දනිති ඔහු සැටි, ඔහු හා හැපෙන්නට ගියොත් තමනට ම රිදෙන බව. අණ ද පිළිපදිති. හේ කිරි බඩ වැල් ගෙණ ඇඹණියන් ගේ ගෙලෙහි ඔතයි. ඕ ගල් ගැසී සිටියි. බඩ වැලින් ගලන ඉස්මෙත් සේදුණු දෙ අතින් ගෙදර-ඇත්තන් ගේ දෙ කම්මුල පිරිමැද හිස සිඹ සනසා, මඳක් දුරට ගොස් හිස ඇළ කැර උන් දෙස බලා තම සිතට සතුට දෙයි හේ. ඉන් පසු අණ දෙයි එය ගලවා රෑ බොජුනට පිළියෙළ කරන්නට.

මල් පැණියට නොගරහන පිට්සර ගැහැ–නුනට නම් මෙබඳු ගහට නො එයි. මල් පැණිය ඒ මිනිසා ලවා කැරවූ මේ දැයෙහි ද රසයෙක් වෙයි.

කොළොඹ කම්දෙරුවෙක නියුතු දෙ යහළු කෙනෙක් රා බෝතල කීපයක් බඩට හිස් කැර – ගෙන කොල්ලු පිටියේ සිට කොම්පඤ්ඤ වීදියට යෙති. නොයෙක් දැ දෙඩවමින් ඒ මේ අත වැනෙමින් මහ ඇද කැර නැනු හ යි නැනුවනට ගරහමින්, සුළඟට ද ගහට කෙරෙමින් යෙති. එකකු අතෙහි වූ කඩදසි කැබැල්ලෙක් ඔහු ගේ අතින් වෙන් ව සුළඟ හා එක් ව ගොස් බෙරේ වැවට බසී. ඔහුට ආ තරහ! අත් පා ඒ මේ අත දිගු කරයි සුළඟට රිදවන්නට, ඉන් නො නවතී. එ පත තම වෙතට ගෙන හොඳ පාඩමක් උගන්වන්නට සිතා එක වර ම පනී වැවට! හා! කුමට ද? පාවෙන පතට ළං වන්නට ද? නෑ, නෑ, මඩෙහි ගැඹර මැනැ - ගන්නට. ඔහු ගේ යහළුවා එ සේ මෙ සේ යහළුවෙක් නො වේ. යහළු–වකු අමාරුවෙක වැටී සිටිය දී පිටු පා පැන යන එකෙක් නො වේ. හේ කුමක් කෙරේ ද? හේ ද පනී වැවට. හා! කුමට ද? යහළුවාට පිහිට වන්නට ද? නෑ, නෑ, තමා ගේ යහළුවා ළඟ ම එරෙන්නට.

මල් පැණියෙන් ලබන හැකි දිරිය! හමන සුළඟට වත් එරෙන මඩට වත් කිසි බයක් නැති ව පළමුවා පිනූ සැටි! යහළුවා වැටී සිටින අමාරුව බලබලා, ඔහුට පිහිටට ගියොත් තමා ද අමාරුයෙහි වැටෙන බව දැන දැන දෙ වනුවා පිනූ සැටි!

දැන් යුද කල යි. එ හෙයින් අහර දුලබ ය. නුහුරු නොයෙක් දැයින් කුස ගිනි නිවන්–නට ය වී තිබෙන්නේ. නොයෙක් දෙසින් ඇසෙයි ''අපට ඒ අහර කන්නට බැරි ය, අපට මේ අහර අගුණ ය, ඒ ඒ අහරින් මේ මේ ලෙඩ වැලැදෙයි' යනු. ළ-තැවෙන්–නෙනි, නොප මේ මල් පැණිය ළඟට ගෙන නිසි සැලැකිලි දක්වූව හොත්, කන්නට ලැබෙන දැ කන්නට බැරි කමෙක් හෝ එය කෑමෙන් ලෙඩ දුකෙක් හෝ නොපට ළං නො වෙයි. මෙහි සබව නොප සිත් වද්දන්නට, කියම් දවසක් එකකු කළ දැයක්.

දඟ දෙලොස් දෙනාකු ගෙන් යුත් පවුලෙකි. ගෙ හැඹිය රෑ බෝජුනට පිසින්නට කරවල ටිකක් කැබැලි කැර මුළු තැන් ගෙයි මැස්සක් උඩ තබා බිම ඇණ හිඳ ගෙන කවරක් දෝ කරයි. ගෙ හිමියා බැහැරකට ගොස් ගස් මදින්නකු සමඟ ගනු–දෙනුවක් කැර පෙරළා අවුත් මුළු තැන් ගෙට ම වදී. එහි දී බිරිය සමඟ දෙඩදෙඩා මැස්ස උඩ වන කරවළ කැබැලි හපහපා බඩට කෙරෙයි. මඳ කලෙකි ගියේ. බිම හුන් හැඹියට නො දන්වා ම අන්තිම කැබැල්ල ද ඔහු කටට වදී.

බලන්න, ගස් මදින්නා සමඟ කළ ගනු – දෙනුවෙහි පල! අමු කරවලෙහි නොරසය සැහැවී රසය ගැන්වී ආ සැටි! නුහුරු කෑමෙන් විය හැකි ලෙඩ දුක් දුරින් ම දුර ගිය සැටි!

මල් පැණිය, සැනැසෙන්න. දැන් පවත්නා යුදය තට නිසි සැලැකිලි ඇදූ දෙනවාට සැකයෙක් නැති.

# ලක්දිවැ 'ගංගා, මහා ගංගා, මහා වාලුකා ගංගා හා කන්දර නදී' කවරේ ද? – 2

සිරිමල් රණවැල්ල

පණ්ඩුකාභය කුමාරයා ධූමරක්ඛ පර්වතය අසලැ කඳවුරේ විසූ කාලයේදී චේතියා නම් යැකින්නක වෙළඹ වෙස් ගනිමින් ඒ අසලැ වූ තුම්බරියඞ්ගණ නම් විලෙහි හැසිරෙන බව ඒ කුමරුට දැනැගන්නට ලැබී ඈය අල්ලා-ගැනීම සඳහා රැහැනක් ද ගෙනැ කුමාරයා ඈය ලුහුබැඳැ ගිය බවත් කුමාරයා ගෙන් බේරීම සඳහා දුවන්නට පටන් ගත් යැකින්න තුම්බරියඞ්ගණ විල වටේ කිහිප විටක් මැ දිවැගොස් ඊළඟට මහාගඞ්ගාවෙන් එ තෙර වැ නැවැතත් මහාගඞ්ගාවෙන් මෙ තෙර වැ යළිත් ධූමරක්ඛපර්වතය වටේ කිහිප වරක් කැරැකී කච්ඡකතිත්ථ හෙවත් කසාතොටින් ගඞ්ගා නම් ගඟට බට නමුත් කුමාරයාට ඈය අල්ලා - ගන්නට හැකි වූ බවත් ඉන් පසු ඈය හා ධූමරක්ඛ පර්වතයට ගොස් එහි අවුරුදු කීහිපයක් විසූ බවත් මහාවංසයෙහි සඳහන් වෙයි.[18] මෙයින් පැහැදිලි වන්නේ ධූමරක්ඛ පර්වතය මහාගඞ්ගා නමින් හැඳින්-වුණු ගඟටත් කලා ඔයටත් අතර ස්ථාන-යෙකැ පිහිටා තුබූ බව යි. ධූමරක්ඛ පර්වතය පිහිටා ඇත්තේ කවර ස්ථානයෙකැ දැ යි සොයාගත හොත් මහාගඞ්ගා යන්නෙන් මහාවංසය හඳුන්වන්නේ කුමන ගංගාවෙක් ද යන්න නිගමනය කිරීම පහසු වනු ඇති.

පොලොන්නරුවට සැතැපුම් පසළොසක් පමණ ගිනිකොනින් හා මදුරු ඔයට සැතැපුම් පහක් පමණ බටහිරින් හා පිහිටා ඇති කඳු ගැටයක් මහාවංසයේ සඳහන් වන ධූමරක්ඛ පර්වතය ලෙස සාමාන්‍යයෙන් හඳුනාගෙනැ ඇතත්[19] එය පිහිටා ඇත්තේ මහවැලි ගඟට දකුණින් හෙයිනුත් මහා-වංසයේ එන චේතියා යැකින්න පිළිබඳ පුවතට අනුවැ එය පිහිටා තුබූ බව පෙනෙන්නේ මහාගඞ්ගා නමින් හැඳුන්වුණු ගංගාවට උතුරින් බැවිනුත් පණ්ඩුකාභය කුමරු විසූ ධූමරක්ඛ පර්වතය එය නොවන බව පැහැදිලි යැ.

ධූමරක්ඛ පර්වතය හඳුනා-ගැනීමට ඉවහල්-වන සාධක කිහිපයක් මහාවංසයෙන් හා වංසත්ථප්පකාසිනියෙන්ද සොයාගත හැකි යැ. උදුම්බර පබ්බත හා උදුම්බරසාල පබ්බත යන නම්වලින් ද ධූමරක්ඛ පර්වතය හැඳින්-වුණු බවත් එය පිහිටා තුබුණේ අනුරාපුරයේ සිටැ යොදුන් නවයක් ඈතින් කසා තොට සමීපයේ බවත් එහි මුදුනට අනුරාපුරයේ ලෝවාමහාපාය දිස් වුණු බවත් වංසත්ථප්ප-කාසිනියෙහි සඳහන් වෙයි.[20] කසාතොට පිහිටා තුබුණේ අනුරාපුරයේ සිටැ යොදුන් නවයක් ඈතින් බව මහාවංසයෙන් ද හෙළි වෙයි.[21] කසාතොටට යොදුන් තුනක් පමණ ඈතින් කොට්ඨිවාල හෙවත් කොට-සර නම් ජනපදයෙක්ද ඒ ජනපදයෙහි කඩවිටි නම් ගමෙක්ද පිහිටා තිබිණි.[22] සද්ධර්මා-ලඞ්කාරයට අනුවැ කඩවිටි නම් ගම පිහිටා තුබුණේ කොටසර තුලාවාපි නම් ජන-

18. මව: X. 53 – 62
19. JCBRASNS. Vol. Vi p. 40
20. Vam. pp. 289. 15 - 16, 505. 14 – 16, 449 25 – 27
21, මව XXIII 23 – 26
22. එ මැ XXIII 19 - 22

පදයේ යි.[23] ධූමරක්ඛ පර්වතය පිහිටා තුබුණේ කලාඔයට දකුණින් එ මෙන් මැ දෙළු කන්දට තරමක් නුදුරින් බවත් තුම්බරියඞ්ගණ නම් විලක් හා කලාඔයේ තොටක් වූ කසාතොට නම් වූ ස්ථානයක් ද ධූමරක්ඛ නම් පර්වතයට නුදුරින් පිහිටා තුබූ බවත් ඉහතින් දක්වූ පණ්ඩුකාභය කුමරු පිළිබඳ පුවතින් හෙළි වෙයි.

මාතලේ දඹුල්ල පාරේ ලෙනදෙරට නුදුරින් මැණික්දෙණ නුවර අසලැ පිහිටා ඇති දූනට දූම්මල් කන්ද නමින් දන්නා පර්වතය මහාවංසයෙහි සඳහන් වන ධූමරක්ඛ පර්වතය බවත් පණ්ඩුකාභය කුමාරයා දූම්මල කන්දේ කලක් ජීවත් වූ බවත් ඒ කාලයේදී යුඩය සඳහා අසුන් පුහුණු කළ තැන දූනට හැඳින්වෙන්නේ 'අසුන් විහිදු තැන්න' නමින් බවත් කියන ජනප්‍රවාදයක් ලෙනදෙර ප්‍රදේශයේ වෙයි.

වංසත්ථප්පකාසිනිය ධූමරක්ඛ පර්වතය උදුම්බර පබ්බත හා උදුම්බරසාළ පබ්බත යනුවෙන් ද හඳුන්වා ඇති බව යට කියන ලදි. උදුම්බර යන්න ධම්පියා අටුවා ගැටපදය සිංහලට නඟා ඇත්තේ 'දුඹුල්' යනු වෙනි.[24] එ බැවින් මුලැ දී දුඹුල් හෝ දුඹුල්හල් නමින් හැඳින්වුණු මේ ස්ථානය පසු වැ දූම්මල් යනුවෙන් පෙරළිණැ යි සිතීමට ඉඩ ඇති. දුඹුල් යන්න උදුම්බර යනුවෙන්ද දුඹුල්හල් යන්න උදුම්බරසාල යනුවෙන් ද පාළියට නැඟියැ හැකි බැවිනි. දූම්මල් කන්ද පිහිටා ඇත්තේ ගඩගා නමින් හැඳින්වුණු කලා ඔයේ ප්‍රධාන ශාඛාවක් වන දඹුලු ඔයට සැතැපුම් -දෙකක් පමණ බටහිරින් හා අඹන් ගඟට සැතැපුම් හයක් පමණ උතුරෙන් හා යැ. අනුරාපුරයේ සිටැ ලෙනදෙරට පැමිණීමට ඇති කෙටි මැ මඟ ලෙස සැලැකියැ හැකි මරදන්කඩවල දඹුල්ල පාරේ ලෙනදෙරට එන එකකුට එහි ළඟා වීම සඳහා සැතැපුම් පනහක් හෝ පනස් පහක් හෝ පමණ දුරක් ගෙවන්නට සිදු වේ. ධූමරක්ඛ පර්වතය පිහිටා තුබුණේ අනුරාපුරයේ සිටැ යොදුන් නවයක් ඈතින් බව ඉහතැ දක්විණි. අනුරාපුර යුගයේ මුල් හරියේ යොදුනක් ලෙස සැලැකුණේ ඉංගිරිසි සැතැපුම් පහක් හෝ හයක් හෝ පමණ දුරක් බව අප වෙත ලිපියෙකින් පෙන්නා දී ඇති.[25] දුටුගැමුණු රජුට රුවන්වැලි සෑයේ වැඩට ඇවැසි රත්රන් ලැබුණේ අනුරාපුරයේ සිටැ යොදුන් තුනක් ඉසාන දෙසින් පිහිටි ස්ථානයෙකින් බව මහාවංසයෙහි සඳහන් වෙයි. [26] අනුරාපුරයට සැතැපුම් දහහතරක් පමණ ඊසාන දෙසින් අනුරාපුරය තිරිකුණාමලය පාරේ 63 වැනි හා 64 වැනි සැතැපුම් කණු අතර පිහිටි රත්පත්විල නමින් දන්නා ගම දුටුගැමුණු රජුට රත්රන් ලැබුණු ස්ථානය බව කියන ජනප්‍රවාදයෙක් ඒ ප්‍රදේශයේ වෙයි. මහාවංස විස්තරය හා මනා වැ ගැලැපෙන බැවින් මේ ජනප්‍රවාදය ඓතිහාසික සත්‍යයක් වශයෙන් පිළිගත හැකි. ඒ අනුවැ ද එ කලැ යොදුනක් ලෙස සැලැකුණේ ඉංගිරිසි සැතැපුම් පහක් හෝ හයක් හෝ පමණ දුරක් බව පැහැදිලි වෙයි. එ බැවින් අනුරාපුරයට සැතැපුම් පනහක් හෝ පනස් පහක් පමණ හෝ දුරින් කලාඔයට දකුණින් එහි මැ ප්‍රධාන ශාඛාවක් වන දඹුලු ඔය අසලැ පිහිටා ඇති දූම්මලකන්ද මහාවංසයෙහි සඳහන් වන ධූමරක්ඛ පර්වතය බව කියන ජන ප්‍රවාදය ඓතිහාසික සත්‍යයක් වශයෙන් පිළිගත හැකි යැ.

ධූමරක්ඛ පර්වතයට යොදුන් තුනක් පමණ ඈතින් කොටසර නම් ජනපදයක් එහි මැ තුලවාපි නම් පෙදෙසක් ද පිහිටා තුබූ බව යට කියන ලදි. දඹුල්ලට සැතැපුම් හතක් ද ලෙනදෙරට සැතපුම් පසළොසක් ද පමණ උතුරින් ඇළහැරට සැතැපුම් 18 ක් පමණ වයඹ දෙසින් පිහිටි කොටගල නම් ස්ථානයේ පිහිටා ඇති පැරණි විහාරය කොටසර පැරණි පියන්ගලු විහාරය බවත් කලා වැව අසබඩැ උතුරු වඩුන්නාව ප්‍රදේශය කොටසර ජනපදයට අයත් වැ තුබූ බවත් අප වෙත ලිපියෙකින් පෙන්නා දී ඇති.[27] කොටගල විහාරයට සැතැපුම් දහ තුනක්

23. සද්. පි. 497
24. ධම්පියා අටුවා ගැටපදය [ධඅගැ] මැදඋයන්ගොඩ විමලකීර්ති සථවිර [1960] පි. 89. 23
25. ලෙස. අංක 2. පි 20-22
26. මව. XXVIII. 13-14
27. සාරද 1. පි. 164 - 166; - ලෙස. අංක. 2, පි. 47-48.

පමණ එමෙන් මැ උතුරු වඩුන්නාවට සැතැපුම් හතරක් පමණ බටහිරින් ලෙනදෙරට සැතපුම් 20 ක් පමණ වයඹ දෙසින් තලාව නමින් දන්නා ස්ථානයෙක් පිහිටා ඇති. පාණව නම් ගමේ නම පාෂාණවාපි යනුවෙන් පාළියට නැඟුණාක් මෙන් මැ තලාව නම් ගමේ නාමය තුලවාපි යනුවෙන් පාළියට නැඟෙන්නට ඇතැ යි සිතියැ හැකි බැවින් කොටසර පිහිටා තුබූ තුලවාපි ජනපදය දැනට තලාව නමින් හැඳින්වෙන ප්‍රදේශයැ යි අඩමාන කළ හැකි යැ. මේ මතය වැරැදි වුවත් කොටසර ජනපදයට කොටගල ප්‍රදේශය අයත් වැ තුබූ බවට සාධක ඇති බැවින් දූම්මල් කන්ද පැරැණි ධූමරක්ඛ පර්වතය බව කියන ජනප්‍රවාදය නිවැරැදි බව ඔප්පු වෙයි. උදුම්බර පර්වතය මුදුනට අනුරාපුරයේ ලෝවාමහාපාය දිස්වුණු බව වංසත්ථප්පකාසිනියේ සඳහන් වන බව යට දක්වන ලදි. දූම්මලකන්දට නැඟුණු විටැ අනුරාපුරයේ ස්තූප මනා වැ දිස් වේ. දූම්මල්කන්ද පැරැණි ධූමරක්ඛ පර්වතය බව කියන ජනප්‍රවාදය නිවැරැදි බවට මෙය ද සාධකයක් කොටැ ගත හැකි යැ. තුම්බරියඩගණ විල පිහිටා තුබුණේ ධූමරක්ඛ පර්වතයට නුදුරිනි. දූම්මල්කන්දට සැතැපුම් පහක් හයක් පමණ වයඹ දෙසින් තුම්බාරෙ නමින් දන්නා වැව් දෙකක් මැ පිහිටා ඇති. තුම්බරියඩගණ විල පසු වැ වැවක් බවට පත්කරන්නට ඇතැ යි සිතීමට ඉඩ ඇති බැවින් එය පිහිටා තිබෙන්නට ඇත්තේ තුම්බාරෙ නමින් දන්නා ප්‍රදේශයේ යැ යි අඩමාන කළ හැකි යැ. දෝළ පර්වතය හෙවත් දෙළු කන්ද පිහිටා තුබුණේත් ධූමරක්ඛ පර්වතයට තරමක් නුදුරිනි. දූම්මල් කන්ද පිහිටා ඇත්තේ දෙළු කන්දේ සිටැ සැතැපුම් දහ අටක් පමණ ඊසාන දෙසිනි. චේතියා නම් යැකින්න අල්ලා - ගැනීමෙන් පසු පණ්ඩුකාභය කුමරු ඇය හා ධූමරක්ඛ පර්වතයට ගොස් සතර අවුරුද්දක් එහි වාසය කළ බව මහාවංසයෙහි සඳහන් වෙයි.[28] එයට විවරණයක් සපයන වංසත්ථප්පකාසිනිය එහි යාමට ප්‍රථම ඇය ගේ භවනයට ගොස් එහි සත් දිනක් වැසැ එයින් නික්මැ චිත්තපස්ස ලෙනදෙර හෙවත් චිත්තස්සනා ලෙනදෙර තබා ඇය මහජනයාට දක්වා ඉන්පසු කඳවුරට ගිය බව දක්වයි.[29] මෙහි චිත්තපස්ස ලෙනදෙර හෙවත් චිත්තස්සනා ලෙනදෙර යනුවෙන් අදහස් කළේ ගල්ගුහාවෙකැ දෙර යැ යි බැලූ බැල්මට පෙනෙන නමුත් චේතියා යැකින්න මෙහි දී මහජනයාට දක්වූ බව කියැවෙන හෙයින් ඇය චිත්තපස්ස ලෙනදෙර නම් ගමට ගෙනවුත් එහි තබා මහාජනයාට දක්වූ හ යි සිතීමට ඉඩ ඇති. දූම්මල කන්ද පිහිටා ඇත්තේ ලෙනදෙර නම් ගම අසලැ බව ඉහතින් සඳහන් කැරිණි. සමහර විටැ මුලැ දී මේ ගම චිත්ත පස්ස ලෙනදෙර හෙවත් චිත්තස්සනා ලෙනදෙර නමින් හැඳින්වුණු බවත් පසු වැ චිත්තස්සනා හෝ චිත්තපස්ස යන කොටස භාවිතයෙහි ගිලිහී ලෙනදෙර යන්නෙන් පමණක් හඳුන්වන්නට පටන් ගත් බවත් සිතිය හැකි යැ. මේ සාධක සියල්ල එක් කොටැ ගත් කලැ දැනට දූම්මල් කන්ද නමින් හැඳින්වෙන්නේ පැරැණි ධූමරක්ඛ පර්වතය බව කියන ජනප්‍රවාදය ඓතිහාසික සත්‍යයක් වශයෙන් පිළිගැනීමට හැකි වෙයි. මේ දූම්මල කන්දට ආසන්න වැ එයට දකුණින් පිහිටා ඇත්තේ අඹන් ගඟ යි. අඹන් ගඟ ගලායන්නේ දූම්මල් කන්දට සැතැපුම් හයක් පමණ දකුණෙනි. යටැ දක්වූ පණ්ඩුකාභය කුමරු හා චේතියා යැකින්න පිළිබඳ පුවතින් ද අපට දැනගන්නට ලැබුණේ ගඞ්ගා නම් ගඟට දකුණින් එමෙන් මැ මහාගඞ්ගා නම් ගඟට උතුරින් ධූමරක්ඛ පර්වතය පිහිටා තුබූ බව යි. එ බැවින් මහාවංසය මහාගඞ්ගා නමින් හඳුන්වා ඇත්තේ අඹන් ගඟ බව මේ සාධකවලින් ඔප්පු වෙයි. (මතු සබැඳි)

28. මව. X. 62.
29. Vam. P. 290, 12-16

එඩියට එවන සියලු පැබැඳුම්
ගල්කිස්සේ හුළුදගොඩ පාරේ — 20/1
එඩියෙහි සකසුවන් නමට එවුව මැනැවි.

# දැනුම

දැනුම! දැනුම! දැනුම! දැනුම!
මෙ සඟර දෙයි ඔබට දැනුම.
මෙ බව තව මැ නැති ද දැනුම?
දැන් වත් ලැබැ - ගන්නැ 'දැනුම'

දැනුම ලබා-දෙන දෙවියෝ
'දැනුම' යැ; ඉන් නොවනු වියෝ.
දැනුමට පති ගණ දෙවියෝ
'දැනුමට' විට දි සිටියෝ.

ලෝ මහ පොත් ගුලේ තිබෙන
සුපතළ සහරින් ලිපි ගෙන
නිවැරැදි සිය බසින් මැ දෙන
'දැනුම' දැනුම වචයි මෙ දින

ලොවැ පළ මහ විදු-දරුවෝ
සරසවි වරමින් සරුවෝ
'දැනුමෙහි' වෙති; එ ඇසුරුවෝ
වෙති ඒ අයුරු මැ සුරුවෝ

දැනුම ලබනුවට වට පිට
ඇවිදැ මුදල් නසනු කුමට?
'දැනුම' මැ එයි ඔබේ ළඟට
දියැ යුතු රුපියලෙකි එයට.

පහතැ පෙනෙන ලිපි යොමුවට
රුපියල් දෙළහක් එවූ විට
අවුරුද්දෙකැ දැනුම ඔබට
ලැබියැ හැකි යැ ගෙදරැ මැ සිට

**කොළොඹ - 1, ගපූර් මන්දිරයේ - 29 1/9,**

**දැනුම ප්‍රකාශකයෝ**

# මේ ඔබට යැ.

පතට පොතට
ලිපි බඳුවට
අපේ ළඟට
එති මූළු රට

ඔබේ පුතුට
ඔබේ දුවට
ඳුවණ මඟට
අපි යැ පිහිට

පහසු මිලට
පිසි විලසට
ගනු - දෙනුවට
එන්නැ මොබට


සීමා සහිත

## ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

කොළොඹ - මහනුවර - ගාල්ල - මීගමුව
අනුරාපුර - මාතර - යාපනය



මරදානේ ජයන්ත වීරසේකර මාවතේ නම්වර 179/1 දරන නිවෙසෙහි (W. D. J.) රත්නායක අප්පුහාමින් විසින් මරදානේ ළ.ඊවර 98 දරන තැනැ පිහිටි අනුල පහරුයෙහි පහරවා පළ කැරිණි.